සී.ස. ලංකා නැව් සංස්ථාව

(1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා සහ රජය සතු ව්‍යාපාරික ආයතන රජයේ සමාගම් බවට පත් කිරීමේ පනත යටතේ 1992.06.01 වන දින සිට සමාගමක් බවට පරිවර්තනය කර ඇත.)

වාර්ෂික වාර්තාව 2013/2014

සී. ස. ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය

2013/2014

පටුන

	පිටු අංකය
පටුන	1
පිළිගැන්වීමේ ලිපිය	2
අධ්‍යක්ෂ මණ්ඩලය	3
කළමනාකරණ කණ්ඩායම	4 – 5
සභාපතිවරයාගේ සමාලෝචනය	6 - 8
අධ්‍යක්ෂ වරුන්ගේ වාර්තාව	9 – 10
විගණන කමිටුවේ වාර්තාව	11 - 12
තුති ප්‍රණාමය හා කාර්ය මණ්ඩලයට ස්තූතිය	13
ස්වාධීන විගණක වරුන්ගේ වාර්තාව	14 – 15
සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය	16
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	17 -18
කොටස් ආයෝජන වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය	19 -20
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	21
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්	22 - 49

ඉංග්‍රීසියෙන් පරිවර්තනය කරන ලද සත්‍ය පිටපතකි.

../05/2016

G. W. Nandasena
(Sworn Translator)
Foreign Languages (English, French, German)
Diploma Holder
14/1A, Daham Pasal Mawatha,
Wewala, Piliyandala.
Tel: 011-2614018, 071-8180885

ශ්‍රී. ස. ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය

2013/2014

පිළිගැන්වීමේ ලිපිය

ගරු වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා,
වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය,
අංක 19, චෛත්‍ය පාර,
කොළඹ 01.

අමාත්‍යතුමනි,

රාජ්‍ය සංස්ථා සහ රජය සතු සමාගම් රාජ්‍ය සමාගම් බවට පරිවර්තනය කිරීම සඳහා වූ 1987 අංක 23 දරණ සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාරව 2013.04.01 දින සිට 2014.03.31 දින දක්වා වූ කාල පරිච්ඡේදය තුල සමාගමේ ක්‍රියාකාරකම් පිළිබඳ සම්පාදිත වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශය මෙයින් ඉදිරිපත් කරමි.

මීට,
විශ්වාසී,

සෂි ධනතුංග
සභාපති
ශ්‍රී. ස. ලංකා නැව් සංස්ථාව
අංක 27, යෝනක ඉස්ලාමීය සංස්කෘතික මධ්‍යස්ථාන ගොඩනැගිල්ල
ශ්‍රීමත් රසික් ෆරීඩ් මාවත
කොළඹ 01
2016.01.20

<u>සී. ස. ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය</u>

<u>2013/2014</u>

අධ්‍යක්ෂ මණ්ඩලය

කාන්චන රත්වත්තේ මහතා
සභාපති
2012.03.14 සිට 2013.10.25 දක්වා

වයිස් අද්මිරාල් ජයනාත් කොළඹගේ මහතා
වැ. බ. සභාපති 2013.10.29 සිට 2014.07.16 දක්වා
සභාපති 2014.07.16 සිට 2015.01.19 දක්වා

එන්. ටී. මහේන්ද්‍ර විජේසේකර මහතා
විධායක අධ්‍යක්ෂ
2012.03.22 සිට 2015.01.19 දක්වා

ආසිරි ඉද්දමල්ගොඩ මහතා - අධ්‍යක්ෂ
2010.05.31 දින සිට 2015.01.19 දක්වා

ආරියසීල වික්‍රමනායක මහතා - අධ්‍යක්ෂ
2010.05.31 දින සිට 2015.01.19 දක්වා

චන්දන ගමගේ මහතා - අධ්‍යක්ෂ
2010.05.31 දින සිට 2015.01.19 දක්වා

අජිත් අබේසේකර මහතා - අධ්‍යක්ෂ/භාණ්ඩාගාර නියෝජිත
2010.06.07 දින සිට 2015.01.19 දක්වා

ඩබ්. ඩී. ප්‍රසන්න පීරිස් මහතා - අධ්‍යක්ෂ
2010.07.15 දින සිට 2015.01.19 දක්වා

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්
ඊ. එම්.එස්. පෙරේරා මහත්මිය
(නීතිඥ, වරාය කළමනාකරණය හා නැව් කටයුතු පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරී නෙදර්ලන්තය)

විගණකවරු
ගජ්මා සහ සමාගම

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම
සමාලෝචිත වර්ෂය තුළදී අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් නවයක් (09) පවත්වන ලදි.

<u>සී. ස. ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය</u>

කළමනාකරණ කණ්ඩායම

සාමාන්‍යාධිකාරී
සුනිල් ඕබඩගේ මහතා
ශාස්ත්‍රවේදි උපාධිධාරී එම්අයිසීඑස් (එංගලන්තය)
නැව් කටයුතු පිළිබඳ ඩිප්ලෝමාධාරී, එම්අයිසීඑස් (ඔස්ලෝ) – (2014 දෙසැම්බර් 31 දින විශ්‍රාම ලැබීය)

අතිරේක සාමාන්‍යාධිකාරී (වාණිජ හා මෙහෙයුම්)
එස්. එම්. ඩී. එන්. ධර්මප්‍රිය මහතා
විද්‍යාවේදී, සාගර අධ්‍යයන විද්‍යාපති (එක්සත් රාජධානිය) එම්අයිඑල්ටී - එංගලන්තය

නෛතික හා රක්ෂණ/මානව සම්පත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
ඊ. එම්. එස්. පෙරේරා මහත්මිය (නීතිවේදී)
(වරාය, නාවික හා ප්‍රවාහන කටයුතු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරී නෙදර්ලන්තය)

මූල්‍ය කළමනාකරු
ජී. එම්. විකුම් ප්‍රදීප මහතා
වාණිජ විද්‍යාවේදී (විශේෂ පංතිය) ගෞරව එල්අයිසීජ්
නාවික කටයුතු කළමනාකරණ විද්‍යාපති (මැල්මෝ - ස්වීඩන්)

අභ්‍යන්තර විගණක
වයි. පොන්නම්පෙරුම මහතා
එෆ්එම්ජ්ඒටී, එල්අයිසීජ්
නාවික කටයුතු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරී (ඔස්ලෝ)

කළමනාකරු - නෛතික හා රක්ෂණ
පී. සමරණායක මහතා
නීතිවේදී
විද්‍යාවේදී (විශේෂ)

කළමනාකාරිනී, ව්‍යාපාර සංවර්ධන
සී. ජයසිංහ එෆ්අයිසීඑස්, එම්අයිඑල්ටී - එංගලන්තය
නාවික කටයුතු පිළිබඳ ඩිප්ලෝමා (ඔස්ලෝ)

කළමනාකරු - (තාක්ෂණික)
එස්. එල්. රාජපක්ෂ මහතා
වරලත් ඉංජිනේරු

කළමනාකාරිනී (නැව් සමාගම් හා ප්‍රලේඛන)
ජයන්තා ඉන්ද්‍රනීල මෙනෙවිය
නාවික කටයුතු පිළිබඳ ඩිප්ලෝමාධාරී (ඔස්ලෝ)

කළමනාකරු (නැව් කුලී සේවා සහ නියෝජ්‍යායතන)
එම්. ඩී. කේ. ජයවංශ මහතා
ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරී
කළමනාකරණ අධ්‍යයනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාධාරී
එෆ්අයිසීඑස් (එක්සත් රාජධානිය) සීඑම්අයිඑල්ටී (එක්සත් රාජධානිය)
ඩීපීඑස් (ගෞරව) ඔස්ලෝ

පරිපාලන ප්‍රධානී
එච්. ආර්. එල්. පී. පී. ගුණරත්න මහතා
කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාධාරී - විවෘත විශ්ව විද්‍යාලය
ව්‍යාපාර තොරතුරු පිළිබඳ ඩිප්ලෝමාධාරී
නාවික පුහුණු වැඩසටහන් පාඨමාලාව - සීඑස්සීඑල්

සී. ස. ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්

2013/2014

සභාපතිවරයාගේ සමාලෝචනය

මූල්‍ය සමාලෝචනය

ශුභවාදී පසුබිමක් තුලින් වාර්ෂික වාර්තාවට සභාපතිවරයා වශයෙන් සමාලෝචනයක් එක් කිරීමට ලැබීම පිළිබඳව මහත් වූ නොමද සතුට ප්‍රකාශ කරමි. ලොවේ සියළුම ප්‍රධාන රටවල් විසින් අනවරතව මුහුණ දෙමින් සිටිනු ලබන ආර්ථික අවපාතයන් හමුවේ නාවික කර්මාන්තයේ විවිධ අභියෝගයන් මධ්‍යයේ වුවද බද්දට පසු ලාභය වශයෙන් රුපියල් මිලියන 250.47 ක ලාභයක් පස්වැනි අවුරුද්දටත් උපයාගෙන තිබේ.

සමාලෝචනයට අදාල වර්ෂය තුලදී සංස්ථාවේ ආදායම රු. මිලියන 850.73 සිට රු.මිලියන 526.81 දක්වා පහත වැටුනු නමුදු වෙනත් විෂයන් තුලින් උපයාගත් අදායම් එනම් ස්ථාවර වත්කම් විකුණා බැහැර කිරීම, කළමනාකරණ ගාස්තු, ලාභාංශ සහ වෙනත් දෑ තුලින් ලැබුණු අදායම රු. මිලියන 48.21 සිට රු.මිලියන 156.92 දක්වා තුන් ගුණයකින් වැඩිවී තිබේ. විකුණා දමන ලද වත්කම් වූ කලී "ලංකා මහපොල" සහ "ලංකා මුදිත" නෞකාවන්ය. ඉහත වර්ෂයේදී ප්‍රවාහනය කරන ලද ගල් අඟුරු මෙ.ටො. 761,280 ට සාපේක්ෂව ප්‍රවර්තන මූල්‍ය වර්ෂය තුල ප්‍රවාහනය කරන ලද ගල් අඟුරු ප්‍රමාණය මෙ.ටො. 1,003,550 ක් වූ අතර ගල් අඟුරු ප්‍රමාණය තුලින් ජනිත වූ අදායම ඉහල ගියේය.

ඉහත වැඩිවීම් මධ්‍යයේ වුවද සමස්ත අදායමේ පහත වැටීමට හේතු වූ අනෙකුත් සාධක නම් ලංකා මහපොල සහ ලංකා මුදිත නෞකාවන්ගෙන් ලැබුණු මුහුදු ගමන් ආදායම හා කුලියට දීමේ අදායම පහත වැටීම යන ඒවාය. අනෙක් අතට පසුගිය වර්ෂයේ (2012/2013) ඉහල ආදායමක් උපයා ගැනීමට හේතු වූ ප්‍රධානම සාධකයක් වන්නේ රජය වෙනුවෙන් වූ යම් යම් ව්‍යාපෘති සඳහා වූ භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ කටයුතු වල සමාගම නිරතවීමය. මෙහිදී සඳහන් කලයුතු කරුණක් වන්නේ එකී ඉහල වටිනාකම් සහ අත්‍යාධික ආනයන් තුල ක්‍රමික බවක් නොමැති වීමයි.

තවද පසුගිය වර්ෂය හා සසඳන කල අපවය වීම් සඳහා රු.මිලියන 7.6 ක් පමණ අඩු ප්‍රතිපාදන වෙන්කිරීම නිසා පරිපාලන වියදම් අඩුවීම මෙහිදී විශේෂයෙන් කිරීම වටී. මෙම ප්‍රවනතාවය තවදුරටත් පවත්වා ගැනිමට කටයුතු කරනු ලැබේ.

නැව් තැනීමේ කොන්ත්‍රාත්තුව

2014 ජනවාරි මස 10 වැනි දින Supermax ප්‍රමාණයේ (Ultramax ගණයේ) වියළි තොග නැව් ඉදිකිරීමේ ගිවිසුමකට අත්සන් කරන ලදි. නැව් තැනීමේ කොන්ත්‍රාත්කරුගේ Weihai හි පිහිටි අංගනයේ මෙම නැව් දෙක සාර්ථකව ඉදිකෙරෙමින් පවතී. නෞකා තලය එලීම කල දිනයේ සිට මාස 23ක කාලයක් තුල එම නැව් භාරදීමට නියමිත අතර ඒ අනුව 2016 ජනවාරියේ සහ අප්‍රේල් මස අවසානයේ දී පමණ සී/ස ලංකා නැව් සංස්ථාවට භාර දීමට නියමිතය.

මෙහිදී සඳහන්කල යුතු තවත් වැදගත් කරුණක් වන්නේ, නැව් තැනීම පිළිබඳ ශක්‍යතා අධ්‍යනයේදී භාවිතා කල තීරණාත්මක පරාමිතිකයන්(පොලී අනුපාතය, අනුග්‍රහ කාලසීමාව සහ ගෙවීමේ කාලසීමාව) සහ නම්‍ය මූල්‍ය සංචිතය තුල තිබෙන්නා වූ විශාල පරතරය ලංකා නැව් සංස්ථාවට ඉතා අහිතකර තත්වයකි. ශක්‍යතා අධ්‍යයනයේ

සඳහන් අපේක්ෂිත මූල්‍ය සම්පාදන සංචිතය, ගෝලීය නැව් තැනීම පිළිබඳ කර්මාන්තය අනුව චීන රජයෙන් ලැබෙන වාසිදායක මෘදු ණයක් වුවද අවාසිදායක මූල්‍ය සම්පාදන විධිවිධාන හේතුවෙන් නැව් මිලදී ගැනීම සිදුවනුයේ වෙළඳපොල මිල ගණන් අභිබවා යමිනි.

එම නිසා ලංකා නැව් සංස්ථාවට මෙම නැව් අත්කර ගැනීම හා ඒවායේ මෙහෙයුම් කටයුතු කිරීමේදී නිරතුරුව වෙනස්වන හා තරඟකාරී වෙළඳපොල තත්වයන් හමුවේ මෙන්ම ඉදිරියේදී ණය ආපසු ගෙවීම සම්බන්ධයෙන් මෙම පරතරය විශාල අභියෝගයක් වනු ඇත.

ආදායම සම්බන්ධයෙන් ගත්කල සංකල්පමය අදියරේදී පුත්තලමේ පිහිටි “ලක්විජය” බලාගාරය සහ යෝජිත සාම්පූර් ගල් අඟුරු බලාගාරය වෙනුවෙන් වන දේශීය අවශ්‍යතාවය සපුරාලීම සඳහා මෙම නැව් අඛණ්ඩව යොදා ගැනීමට අපේක්ෂා කරන ලදි. කෙසේ නමුත් ශක්‍යතා අධ්‍යයනය තුලින් බලාපොරොත්තු වූ පරිදි සාම්පූර්හි බලාගාරය 2016 දී එහි මෙහෙයුම් කටයුතු සිදුකිරීම සහ ඒ සඳහා 2015 අවසන් භාගයේදී හෝ අවශ්‍ය වන ගල් අඟුරු සංචිතගත කිරීම යථාර්ථයක් වීම ඉතා අවිනිශ්චිත වේ.

ශක්‍යතා අධ්‍යයන වාර්තාවේ ඇස්තමේන්තු කරන ලද පරිදි දිනකට එ.ජ. ඩොලර් 20,000 සමඟ සසඳන කල Supermax යාත්‍රා සම්බන්ධයෙන් වන Baltic Exchange ආයතනය විසින් Baltic Time Charter සාමාන්‍ය ගාස්තු අනුප්‍රමාණය වත්මන් 2013/14 මූල්‍ය වර්ෂයේ අවසන් දිනය වන විට දිනකට එ.ජ.ඩොලර් 11,402 කි.

නැව් කර්මාන්තයේ පිළිගත් විශ්වාසයක් හා සිද්ධාන්තයක් නම් චක්‍රානුකූලව සෑම අවුරුදු 10කට වරක් එහි උච්චාවචනයන් සිදුවන බවය. කර්මාන්තය පිළිබඳ විශ්ලේෂකයින් ප්‍රකාශ කරන්නේ 2016 දී, වියළිතොග නැව් කර්මාන්තය සම්බන්ධයෙන් බොහෝ කලක් අපේක්ෂාවෙන් සිටි පිබිදීම ඇතිවන බවය. එම අනාවැකිය යථාර්ථයක් වුවහොත් ලංකා නැව් සංස්ථාවට එය අස්වැසිල්ලක් වන්නේය. අනෙක් අතින් බලන කල ගත් ණය ආපසු ගෙවීමේදී 2016 අගෝස්තු මාසයේ සිට නැව් දෙක සඳහා දිනකට එ.ජ. ඩොලර් 31,041.16 ගණනේ වාරික මුදල් මෙන්ම 5.55%+ මාස 6ක LIBRO (නවතම) අනුප්‍රමාණ අනුව පොලියක්ද ගෙවීමට සිදුවේ. අපෝක්ෂා කරන ලද නාවික කුලී ගාස්තු අයකර ගැනීමට නොහැකිවීමට ඉඩ ඇති භූමිකාවක් තුල සිදුවිය හැකි ගෙවීම් පැහැර හැරීමකදී රාජ්‍ය ආයතන වන මහජන බැංකුවද මෙන්ම සංස්ථාවට ද පාඩු අවම කර ගැනීමේදී අහිතකර බලපෑමක් ඇතිවනු ඇති අතර ඒ සඳහා ඇති සියළු විකල්ප දැඩිසේ අනුගමනය කිරීමට සිදුවේ.

මේ සියල්ලටම වඩා, අභියෝගයන්ට කාලානුරූපව මුහුණ දීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව ඉහල කාර්යක්ෂමතාවයකින් යුත් පෞද්ගලික අංශයේ නාවික කටයුතු මෙහෙයවන්නන්/කුලියට දෙන ආයතන සමඟ තරඟ කරන්නට සිදුවීම වූ කලී අතිශය ප්‍රශ්ණ මෙන්ම විමර්ෂණය කළ යුතු එකක් වන අතර ඊට වහා පිළියම් යෙදිය යුතුවේ. එම නිසා තම පැවැත්ම උදෙසා ප්‍රමුඛ කාර්යයක් ලෙස මෙම කර්තව්‍යය වෙනුවෙන් වාණිජමය නිදහසක් අමාත්‍ය මණ්ඩලය වෙතින් ලබාගැනීම අවශ්‍ය වේ.

අනෙකුත් නාවික කේන්ද්‍රස්ථාන 05 තුල ශ්‍රී ලංකාව ද දකුණු ආසියාවේ නාවික කේන්ද්‍රස්ථානයක් බවට පරිවර්තනය කිරීමට නැව් තැනීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම ශ්‍රී ලංකා නැව් සංස්ථාවේ ප්‍රගමණ සැලසුමේ කොටසක් වන බව මෙහිදී සඳහන් කරනු වටී. මෙම කාර්යාර්ථයේදී විදේශ විනිමය ඉපැයීම් වැඩිකර ගැනීම සඳහා රජය විසින් නාවික කටයුතු පිළිබඳ අධ්‍යාපනය වැඩිකිරීම ඉලක්ක කොට තිබේ.

නොයෙකුත් විෂය නිර්දේශ අනුව පෞද්ගලික අංශයේ නාවික පාසැල්, සිද්ධාන්තමය අදියර පාඨමාලාවන් සාර්ථකව පවත්වන නමුදු නාවික නිලධාරින් සහ නිල නොදරන නැවියන්ට අනිවාර්ය නාවික පුහුණුව ලබාදීම සඳහා ලංකා නැව් සංස්ථාවට ජාතික නැව් ඇණියක් නොමැති වීම නිසා දශක දෙකකට වඩා කාලයක් තිස්සේ

නැවියන් බිහිකිරීමට විශාල බාධාවක්ව වී තිබුණි. මෙම ප්‍රශ්ණයට පිළියමක් වශයෙන් අමතර වියදමක් දරා නැව් සංස්ථාවේ මෙම නැව්වලට විශේෂ ඉඩ ඇති තට්ටුවක් සැලසුම් කරන ලදි.

නැව් සංස්ථාවේ එක් නැවකින් ඕනෑම අවස්ථාවක කැඩෙට්වරුන් 12 දෙනෙකුට පුහුණුව ලබාදිය හැකි අතර මෙම තරඟකාරී කර්මාන්ත ක්ෂේත්‍රයේ හිමිකරුවන්/මෙහෙයුම් කටයුතු සිදුකරන්නන් සමඟ සසඳා බලන කල සංස්ථාවට මෙය අතිරේක පුනරාවර්තනීය ස්ථිර පිරිවැයක් වේ. කෙසේ නමුත් "නිදහස් අධ්‍යාපනය" යටතේ මෙරට තුල අධ්‍යාපනය සඳහා පිරිනමනු ලබන මෙවැනි වෘත්තීය/තෘතීය අධ්‍යාපන ප්‍රස්ථාවන් අතර නාවික පුහුණුව ලබාදීම ද ප්‍රශංසනීය පියවරක් වේ. මෙයින් දිගුකාලීන සමාජ ආර්ථික ප්‍රතිලාභ නියත වශයෙන්ම රටට අත්වේ.

<u>රජයේ නැව් බඩු ප්‍රවාහනය කිරීම</u>

අදාල මහභාණ්ඩාගාර හා මහබැංකු චක්‍රලේඛයන් හා මාර්ගෝපදේශ තරයේ අනුගමනය කරමින් රාජ්‍ය අංශයේ සියළු නැව්බඩු ආනයනය කිරීම සඳහා ලංකා නැව් සංස්ථාව සියළු ප්‍රයත්න දැරිය යුතුය. අඛණ්ඩ අලෙවි සංචාර, ටෙන්ඩර් අන්වේෂණය කිරීම, රජයේ නව ව්‍යාපෘති හඳුනාගැනීම සහ ඒවා අධීක්ෂණය කිරීම ප්‍රධාන කරුණු වේ.

<u>මානව සම්පත් සංවර්ධනය</u>

නැව් අත්පත් කරගැනීම හා මෙහෙයුම් කටයුතු කිරීම සම්බන්ධයෙන් වන ඉහත කී අභියෝග හමුවේ නොයෙකුත් ජාත්‍යන්තර නීති සංග්‍රහයන්ට නීතිරීති හා රෙගුලාසිවලට අනුව කටයුතු කරමින් කාර්යක්ෂම ලෙස සේවය කිරීම සඳහා අවශ්‍ය මිනිස්බලය වැඩිකර ගැනීමට ලංකා නැව් සංස්ථාවට අවශ්‍ය වන්නේ නාවික යාත්‍රා වැඩිකාලයක් මෙහෙයවමින් ආදායම සහතික කරගැනීම සඳහාය. තාක්ෂණික, කුලීසේවා, මූල්‍ය හා නෛතික දෙපාර්තමේන්තු සතර විසින් 1997 න් පසුව නැව් කළමනාකරණය හා මෙහෙයුම් කටයුතු කිරීම සම්බන්ධයෙන් සුවිශාල කාර්යභාරයක් ඉටුකිරීමට තිබේ.

<u>සුභසාධන කටයුතු</u>

ලංකා නැව් සංස්ථාවේ සුභසාධන හා විනෝද කටයුතු සමිතිය හරහා සමාගම විසින් සේවක සුභසාධන කටයුතු සිදුකෙරෙමින් පවතී. කෙසේ නමුත් එය වඩාත් කාර්යක්ෂම, ඵලදායී, විනිවිද භාවයෙන් සහ වගවීමෙන් යුක්ත එකක් බවට හැඩගැස්විය යුතුය.

සමාගමේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ

වාර්ෂික වාර්තාව 2013/2014

19 වැනි වාර්ෂික මහා සභා රැස්වීම සඳහා ඉදිරිපත් කිරීම සඳහා 2014 වර්ෂයේ මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ විගණනය කරන ලද ගිණුම් සමඟ තම වාර්තාව ලංකා නැව් සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන්නේ ඉමහත් සතුටිනි.

වර්ෂය පිළිබඳ සමාලෝචනය

සමාගමේ ප්‍රධාන කටයුතු වන්නේ නැව් බඩු මුහුදු මගින් ප්‍රවාහනය කිරීම ඒ ඒ ස්ථාන දක්වා ඒවා බෙදා හැරීම, නැව් බඩු ප්‍රවාහනය සඳහා රැස්කිරීම, ශ්‍රී ලාංකික තානාපති කාර්ය මණ්ඩලයන්හි ගෘහ භාණ්ඩ හා පෞද්ගලික බඩු බාහිරාදිය එක් එක් රටවල් කරා රැගෙන යාම, රේගුවේ (Customs House) නියෝජ්‍යායතන කටයුතු, නාවික නියෝජ්‍යායතන සේවා, නැව් හිමියන්, කළමනාකරුවන් හා මෙහෙයුම්කරුවන් කුලියට දෙන ආයතන ආදිය වේ.

බහාලුම්ගත, විසිරිතොග, ගල් අඟුරු තොග, වාහන, ව්‍යාපෘති සඳහා වූ නැව්බඩු, බර නැව්බඩු වැනි සියළු ආකාරයේ නැව් බඩු ප්‍රවාහනය කිරීමයි.

මූල්‍ය ප්‍රකාශ

2007 අංක 7 දරණ සමාගම් පනතේ 151 වගන්තියේ නියමයන්ට අනුකූලව පිලියෙල කරන ලද වාර්ෂික වාර්තාවේ පිටු අංක 16 සිට 49 දක්වා වූ පිටුවල මූල්‍ය ප්‍රකාශ දැක්වේ.

ස්වාධීන විගණක වරුන්ගේ වාර්තාව

මූල්‍ය ප්‍රකාශ පිළිබඳව විගණකයින්ගේ වාර්තාව මෙම වාර්තාවේ 15 සහ 16 වැනි පිටුවල දක්වා ඇත.

ගිණුම් ප්‍රතිපත්ති හා පැහැදිලි කිරීම් සටහන්

සමාලෝචනයට අදාල වර්ෂය තුලදී සමාගම විසින් අනුගමනය කරන ලද ගිණුම් ප්‍රතිපත්තිවල වෙනසක් සිදුවී නැත. මූල්‍ය ප්‍රකාශ පිලියෙල කිරීමේදී භාවිතා කරන ලද ගිණුම් ප්‍රතිපත්ති හා පැහැදිලිකිරීම් සටහන් පිටු අංක 22 සිට 49 දක්වා සඳහන්කොට ඇත.

මූල්‍ය ප්‍රතිඵල/ලාභ සහ විසර්ජන

සවිස්තරාත්මක අදායම් ප්‍රකාශය 17 වැනි පිටුවේ දැක්වේ.

දේපළ, පිරියත හා උපකරණ

සමාලෝචනයට අදාල වර්ෂය තුලදී සමාගම රු.මිලියන 1.9 ක් දේපොළ, පිරියත හා උපකරණ යන විෂයන්හි ආයෝජනය කොට ඇත. මූල්‍ය ප්‍රකාශ සඳහා වූ අංක 10 දරණ සටහන මගින් වර්ෂය තුලදී දේපොළ, පිරියත හා උපකරණ වල සංසරණය පිළිබඳ විස්තර දැක්වේ.

<u>ආයෝජන</u>

2014 මාර්තු 31 දිනට සමාගම විසින් සිදුකරන ලද දිගුකාලීන ආයෝජන පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශ සඳහා වූ 13,14 සහ 15 සටහන්වල 35 සිට 38 දක්වා පිටුවල දැක්වේ.

<u>ලාභාංශ</u>

2014 මාර්තු 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා ලාභංශ ගෙවීම අධ්‍යක්ෂ මණ්ඩලය නිර්දේශ නොකරයි.

<u>ප්‍රකාශිත ප්‍රාග්ධනය</u>

2007 අංක 7 දරණ සමාගම් පනතේ නියමයන් ප්‍රකාරව 2014 මාර්තු 31 දිනට ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.50,000,000 ක්වේ. 43 පිටුවේ ඇති මූල්‍ය ප්‍රකාශ සඳහා වූ සටහන් අංක 23 හි විස්තර දැක්වේ.

<u>ක්‍රියාත්මක සමාගමක් බව</u>

සමාගමේ ව්‍යාපාරික සැලැස්ම අධ්‍යක්ෂකවරුන් විසින් සමාලෝචනය කොට තිබෙන අතර ක්‍රියාත්මක සමාගමක් වශයෙන් තවදුරටත් පැවතීම සඳහා ප්‍රමාණවත් සම්පත් ඊට ඇතිබවට ඔවුන් සෑහිමකට පත්ව සිටිති._එබැවින්, මූල්‍ය ප්‍රකාශ එම පදනම මත පිළියෙල කරන ලදි.

සී/ස ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය

2013/2014

විගණන කමිටුවේ වාර්තාව

පත්කිරීම:

යහ පාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශයන්හි ක්‍රම පද්ධති පාලන කමිටු යනුවෙන් වූ 7 වෙනි පරිච්ඡේදයේ 7:4:1 විෂයාංගය ප්‍රකාරව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් විගණක කමිටුව පත්කෙරිණි.

විගණන කමිටුවේ කාර්යභාරය:

විගණක කමිටුවේ කාර්යය හා වගකීම් පහත සඳහන් පරිදි වේ. මණ්ඩලයේ අනු කමිටුවක්ව,

- අදාල ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (IFRS) සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (SLFRS) සහ අදාල නෛතික හා පාලනාත්මක නියමයන්ට අනුව මූල්‍ය වාර්තාකරණය සිදුකිරීම සහතික කිරීමේ කාර්යය සුපරීක්ෂණය කිරීමේදී විගණන කමිටුව, මණ්ඩලයට සහභාගී විය යුතුය.

- ව්‍යාපාරයේ උපකාරක සමාගම් සම්බන්ධයෙන් අදාල වන්නා වූ ප්‍රශ්ණගත කරුණු කිසිවක් වේ නම් විගණන කමිටුව විසින් ඒවා ක්‍රමික පදනමක් මත විසඳීමට පියවර ගත යුතුය.

- ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රම පද්ධතියක් හඳුන්වා දීමට සහ ක්‍රියාත්මක කිරීම පිණිස විගණන කමිටුව මණ්ඩලයට සහය දිය යුතුය.
- අභ්‍යන්තර විගණකයන්ගේ අනවරත අපක්ෂපාතීත්වය හා ඔවුන්ගේ කාර්යක්ෂමතාවය විගණන කමිටුව විසින් සමාලෝචනය කරනු ලැබිය යුතුය.

- රජය විසින් නිකුත් කරනු ලැබ තිබෙන අදාල සියලු නීතිරීති, රෙගුලාසි සහ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරනු ලැබේදැයි සහතික කිරීම සඳහා ඒවා නිරතුරුව සමාලෝචනය කිරීම හා අන්වේෂණය කිරීම සිදුකොට ඉන් ඉක්බිතිව, අනනුකූලව කටයුතු කිරීම සම්බන්ධයෙන් මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම.

- විගණන කමිටුව විසින් අභ්‍යන්තර/බාහිර විගණන වාර්තා, කළමනාකරණ ලිපි සහ රාජ්‍ය ව්‍යවසාය කමිටුවේ නිර්දේශ සමාලෝචනය කරනු ලැබීමෙන් ඉක්බිතිව ඒ සඳහා පිළියම් වශයෙන් ගන්නා ක්‍රියාමාර්ගවලදී මණ්ඩලයට සහාය දැක්විය යුතුය.

- කමිටුවේ නිරීක්ෂණ වාර්ෂික වාර්තා වලට ඇතුලත් කිරීම සඳහා ඒ පිළිබඳ වාර්තාවක් විගණන කමිටුව පිළියෙල කල යුතුය.

- රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් සංශෝධනය කරන ලද 2010.12.14 දිනැති අංක 55 දරණ යහපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ, රාජ්‍ය ව්‍යවසායන් හි විගණන කමිටුව ක්‍රියාත්මක කිරීම පිළිබඳ උපදෙස් සංග්‍රහයක් ලෙස භාවිතා කළ යුතුය.

විගණන කමිටුවේ සංයුතිය:

- මෙම කමිටුව, අඩුම තරමින් භාණ්ඩාගාර නියෝජිතයෙකුගෙන් ද අදාල රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරීවරයා ඇතුළු විධායක බලතල නොමැති අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

- විගණන කමිටුවේ සභාපතිත්වය, භාණ්ඩාගාර නියෝජිතයෙකු හෝ මූල්‍ය කළමනාකරණ කටයුතු පිළිබඳ නිපුණතාව සහිත තැනැත්තෙකු විසින් දැරීම වඩා යෝග්‍ය වේ.

- විගණකාධිපති දෙපාර්තමේන්තුවේ/බාහිර විගණක නියෝජිතයෙකු හෝ විගණන කමිටුවේ සේවය සඳහා අත්‍යාවශ්‍ය වන වෙනත් යම් තැනැත්තකු නිරීක්ෂක මට්ටමි විසින් කටයුතු කිරීම සඳහා කැඳවිය හැකිය.

- අවශ්‍යවේ නම් ආරාධනා කිරීම මගින්, සාමාන්‍යාධිකාරී, මූල්‍ය කළමනාකරු සහ සෙසු ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ට විගණන කමිටුවට සහභාගී වීමට හැකිවන පරිදි කටයුතු පිළියෙල කල යුතුය.

- අදාල වාර්තා ආදිය ද ඉදිරිපත් කිරීම ආදිය මගින් අභ්‍යන්තර විගණන චරියා විගණක කමිටුව විසින් තීරණ ගනු ලැබීමේදී සහය දැක්විය යුතු අතර, අධ්‍යක්ෂක මණ්ඩලයේ ලේකම් ලෙස කටයුතු කල යුතුය.

රැස්වීම්

- විගණන කමිටුව යටත් පිරිසෙයින් මාස 03කට වතාවක්වත් රැස්විය යුතු අතර, එකී රැස්වීම් වලට සියළු කමිටු සාමාජිකයන් සහභාගී විය යුතු වේ.
- රැස්වීම් න්‍යාය පත්‍ර පිළියෙල කරනු ලබන අතර, විස්තර පත්‍රිකා සමඟ ඒවා සාමාජිකයන්ට කල්වේලා ඇතිව බෙදා හරිනු ලබන අතර, විගණන කමිටු තීරණ ක්‍රමානුකූලව සටහන් කොට අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය සඳහා වාර්තා කරනු ලැබේ.

සමාලෝචන

අදාල වර්ෂයේදී විගණන කමිටුව විසින් පහත දැක්වෙන දේ සමාලෝචනයට භාජනය කරන ලදි.

- විගණන වැඩසටහන - 2013/2014
- අභ්‍යන්තර පාලන පද්ධතිය - 2013/2014
- අමාත්‍යාංශ වෙත පවරන ලද වත්කම්
- යාත්‍රා බෙදාහැරීමේ හා වෙනත් ගාස්තු ප්‍රතිපූර්ණය කිරීම.

සවිස්තරාත්මක අදායම් වාර්තාව 2013/2014

- බෙන්තොට - නිවාඩු නිකේතනය (Holiday Bungalow) - කපා හැරීම
- සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද, ලන්ඩන් කාර්යාලයේ හා කරච්චි කාර්යාලයේ වට්ටෝරුගත භාණ්ඩ, පොතෙන් කපාහැරීම.

නිගමනය

විගණන කමටුවේ නිර්දේශ යෝජනා අනුව අදාල කටයුතු සිදුකරන්නේදැයි තහවුරු කරගනු පිණිස ප්‍රමාණවත් ලෙස පසුවිපරම් ක්‍රියා පරිපාටින් අනුගමනය කරනු ලැබේ.

කමිටුව වෙනුවෙන්,

අජිත් අබේසේකර
විගණන කමිටුවේ සභාපති

සී.ස. ලංකා නැව් සංස්ථාව
වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය

තුති ප්‍රණාමය හා කාර්ය මණ්ඩලයට ස්තූතිය

ගරු වරාය, නාවික අමාත්‍යතුමා විසින් ලංකා නැව් සංස්ථාවට නොකඩවා පළකරන ලද උපරිම සහයෝගය සහ උපදෙස් වෙනුවෙන් අපගේ ප්‍රණාමය හිමිවේ.

සංස්ථාවේ අභිමතාර්ථයන් මුදුන්පත් කරගැනීමෙහිලා වරාය හා නාවික අමාත්‍යාංශයේ නිලධාරී මහත්ම මහත්මීන් විසින් දෙනලද සහයෝගය වෙනුවෙන් නාවික සංස්ථාව ස්වකීය ස්තූතිය පළකරයි. එමෙන්ම ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ශ්‍රී ලංකා රේගුව සහ විදේශීය නියෝජිතයින් විසින් සංස්ථාව වෙත සැමවිටම පළකරන ලද සහයෝගය සහ සුහදශීලීබව වෙනුවෙන් ද සංස්ථාව තම කෘතවේදීතාවය පළ කරයි.

සංස්ථාවේ සේවාවන් ලබාගත් ගණුදෙනුකරුවන් වෙනුවෙන් හා ඔවුන්ගෙන් ලද සහයෝගය වෙනුවෙන් සංස්ථාව තම කෘතවේදී බව ප්‍රකාශ කරයි.

කාර්ය මණ්ඩලයට ස්තූතිය

සුහදශීලි සහ සහයෝගශීලි භාවයෙන් යුතුව, සමාලෝචිත වර්ෂය තුලදී කළමනාකාරිත්වය/ සේවක මහත්ම මහත්මීන් සම්බන්ධතා වැඩිදියුණුවට මහ පෑදුනි.

කළමනාකාරිත්වය සමඟ කටයුතු කිරීමේදී වෘත්තීය සංගම් ඉතා වගකීමෙන් හා ප්‍රතිචාරාත්මකව කටයුතු කළ බව කිවමනාය.

අවසාන වශයෙන් එතෙර හා මෙතෙර සියලු සේවක මහත්ම මහත්මීන් විසින් විශේෂයෙන්ම නාවික ක්ෂේත්‍රය මුහුණ දෙමින් සිටින දුෂ්කර කාලවකවානුවක ආයතනය වෙත සේවය ඉටුකිරීමේදී දක්වන ලද පක්ෂපාතී බව හා කැපවීම අගය කළ යුතුය.

<u>ගජ්මා ඇන්ඩ් කම්පනි</u>
<u>වරලත් ගණකාධිකාරීවරු</u>

වරලත් ගණකාධිකාරීන්
52/1 නන්දන ගාඩ්න්ස්
ඩුප්ලිකේෂන් පාර
කොළඹ 04
ශ්‍රී ලංකාව

ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව
සී/ස ලංකා නැව් සංස්ථාවේ කොටස් හිමියන් වෙත,

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ වාර්තාව

සී/ස ලංකා නැව් සංස්ථාව (සමාගම) ට අයත් මීට යා කොට ඇති 2014 මාර්තු 31 දිනට පැවති ශේෂ පත්‍රය එකී වර්ෂාවසාන සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය සහ කොටස් ස්කන්ධ වෙනස්වීම් සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශ, කැපී පෙනෙන ගිණුම් ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශයන් සහ අනෙකුත් පැහැදුම් සටහන් ද අප විසින් විගණනය කරන ලදි.

මූල්‍ය ප්‍රකාශනය සම්බන්ධයෙන් කළමනාකාරිත්වයේ වගකීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුව මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කොට සාධාරණ අයුරින් ඉදිරිපත් කිරීම කළමනාකාරිත්වයේ වගකීම වේ. වංචා හා ප්‍රමාද දෝෂ හේතු කාරක වී තිබුනද, නොතිබුනද වැදගත් අවප්‍රකාශවලින් තොරව අදාල මූල්‍ය ප්‍රකාශ පිළියෙලකොට සාධාරණව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වන අභ්‍යන්තර පාලනය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙනයාම යනාදි කරුණුද, ප්‍රශස්ත ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම යන කරුණුද ඊට ඇතුලත් වේ.

විගණනයේ විෂය පථය හා මතයට පාදක වූ කරුණු:

අපගේ වගකීම වන්නේ අප විගණනය පදනම් කර ගනිමින් මෙම මූල්‍ය ප්‍රකාශ පිළිබඳව මතයක් පළ කිරීමය. පහත සඳහන් ඡේදවල සාකච්ඡා කර ඇති කරුණු හැරුණු විට අපගේ විගණනය ඉටුකර ඇත්තේ ශ්‍රී ලංකා විගණන ප්‍රතිපත්ති වලට අනුකූල අයුරිනි. අදාල මූල්‍ය ප්‍රකාශ සැලකිය යුතු අවප්‍රකාශවලින් තොරව පවතින්නේ ද නොපවතින්නේ ද යන්න පිළිබඳව විගණනය සැලසුම්කොට ක්‍රියාවට නැංවීම යන කරුණු එකී ප්‍රමිතීන්ගෙන් අපේක්ෂා කෙරේ.

මූල්‍ය ප්‍රකාශවල අගයන් සහ හෙළිදරව් කිරීම්වල උපකාරක සාක්ෂි සෝදිසි පදනමක් මත පරීක්ෂා කිරීම විගණනයකට ඇතුළත් වේ. කළමනාකරණය විසින් භාවිත කරන ලද ගිණුම් ප්‍රතිපත්ති හා කැපී පෙනෙන ඇස්තමේන්තුව තක්සේරු කිරීම මෙන්ම මූල්‍ය ප්‍රකාශවල සමස්ත ඉදිරිපත් කිරීම ඇගැයීමේ කාර්යය ද විගණනයට ඇතුළත් වේ.

මතය දක්වා ඇති පහත සඳහන් ඡේදයේ සාකච්ඡා කරනු ලැබ ඇති කරුණු හැරුනුකොට අපගේ උපරිම දැනීම හා විශ්වාසය අනුව අපගේ විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු හා පැහැදිළි කිරීම් ලබා ගතිමු. එබැවින්, අපගේ විගණනය තුලින් අපගේ මතය සාධාරණ අයුරින් පිළිබිඹුවන්නේ යයි අප විශ්වාස කරමු.

මතය:
අපගේ මතයට අනුව මේ දක්වා අපගේ පරීක්ෂණවලින් පෙනීයන පරිදි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සමාගම විසින් 2014 මාර්තු 31 දිනට අවසන් වර්ෂය වෙනුවෙන් නිසි ගිණුම් වාර්තා පවත්වාගෙන ගොස් ඇති බවත් එකී වර්ෂය අවසානයට සමාගමට අදාල මූල්‍ය ප්‍රකාශවලින් සහ සමාගමේ, ලාභ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශ වලින් 2014 මාර්තු 31 වනවිට සමාගමේ කටයුතු පිළිබඳව සත්‍ය හා සාධාරණ මතයක් පිළිබිඹුවන බවත් කිව හැකිය.

ස්වකීය උපකාරක සමාගමක් වන ෂිපිං ඒජන්සි (පෞද්ගලික) සමාගම සම්බන්ධයෙන් වන විගණන කටයුතු තවමත් ඒකාබද්ධ කොට නොමැති හෙයින් සහ එය ක්‍රියාත්මක නොවෙමින් තිබෙන ආයතනයක් බැවින් අපගේ මතය පැහැදිලි කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශයන්හි 12 වැනි සටහන වෙත අවධානය යොමුකිරීමට කැමැත්තෙමු.

වෙනත් නෛතික හා පාලනාත්මක නියමයන් පිළිබඳ වාර්තාව

2007 අංක 7 දරණ සමාගම් පනතේ 153 (6) වගන්තිය හැරුනු කොට මෙහි මූල්‍ය ප්‍රකාශ එම පනතේ 152(2) වගන්තියේ සඳහන් නියමතාවන් සමඟ ද අනුකූල වන බව අපගේ මතය වේ.

අත්. කළේ.

ගජ්මා ඇන්ඩ් කම්පනි
වරලත් ගණකාධිකාරීවරුන්
2015 ඔක්තෝම්බර් 19 දින
කොළඹදීය.

සී.ස. ලංකා නැව් සංස්ථාව

මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සවිස්තරාත්මක ආදායම් වාර්තාව

	සටහන	2014	2013 (නැවත ප්‍රකාශිත)
ආදායම	4	526,818,688	850,732,686
සෘජු මෙහෙයුම් වියදම්		(237,320,894)	(488,480,473)
දළ ලාභය		**289,497,794**	**362,252,213**
වෙනත් ආදායම්	5	156,924,674	48,218,207
පරිපාලන වියදම්		(191,555,882)	(199,210,843)
මෙහෙයුම් වලින් ලාභය	6	254,866,586	211,259,577
ශුද්ධ මූල්‍ය ආදායම	7	38,851,992	39,171,346
ආශ්‍රිත සමාගම් වල ශුද්ධ බදු සහිත ලාභය	13.2	15,449,315	21,387,767
බද්දට පෙර ලාභය		**309,167,893**	**271,818,690**
ආදායම් බදු වියදම්	8	(58,690,220)	(55,918,925)
වර්ෂය සඳහා ලාභ		**250,477,673**	**215,899,765**
කොටසක් සඳහා මූලික හා තනුක ඉපයීම්	9	50.10	43.18
වර්ෂය සඳහා ලාභ		250,477,673	215,899,765
වෙනත් සවිස්තරාත්මක ආදායම්			
විකිණීම සඳහා වූ මූල්‍ය වත්කම් වල සාධාරණ අගය වෙනස්වීම මත පාඩු	15.1	(6,830,018)	(6,368,110)
ජීවගණක උපකල්පන වෙනස්කම් වලින් උද්ගත වූ පාඩු	27.1	687,082	2,184,806
ආශ්‍රිත සමාගම්වල අනෙකුත් සවිස්තරාත්මක ආදායමේ කොටස (බදු සහිත)	13.2	6,080	9,762
වර්ෂය සඳහා මුළු සවිස්තරාත්මක ආදායම		**244,340,817**	**211,726,223**

අංක 8 සිට 34 දක්වා පිටුවල සඳහන් ගිණුම් ප්‍රතිපත්ති හා සටහන්, මූල්‍ය ප්‍රකාශයන්හි අවම කොටසක් නියෝජනය කරයි.

සී.ස. ලංකා නැව් සංස්ථාව
මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2014 රු.	2013 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	10	20,256,048	72,858,715
ස්පර්ශනීය නොවන වත්කම්	11		
පාලිත සමාගම් වල ආයෝජන	12		
ආශ්‍රිත සමාගම් වල ආයෝජන	13	239,773,084	225,176,388
විකිණීමට ඇති මූල්‍ය වත්කම්	15	30,997,790	37,827,808
විලම්භිත බදු වත්කම්	16	3,947,404	3,180,367
ජංගම නොවන මුළු වත්කම්		**294,974,326**	**339,043,277**
ජංගම වත්කම්			
වට්ටෝරුගත භාණ්ඩ		533,481	2,221,735
වෙළඳ හා වෙනත් ලැබීම් නියමිත	17	1,215,690,954	1,153,675,616
ව්‍යවස්ථාපිත ලැබීම් නියමිත	18	38,140,327	38,140,327
කල්පිරීම් සඳහා ආයෝජන	19	291,653,566	131,700,530
කෙටිකාලීන ආයෝජන	20	224,010,853	204,820,643
මුදල් හා මුදල් සාම්‍ය යන්	21	67,550,337	73,186,619
මුළු ජංගම වත්කම්		**1,837,579,518**	**1,603,745,470**
විකිණීම සඳහා රඳවාගත් වත්කම්	22		12,326,800
මුළු වත්කම්		**2,132,553,844**	**1,955,115,548**
කොටස් ස්කන්ධ බැරකම්			
කොටස් ස්කන්ධය			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	23	50,000,000	50,000,000
කොටස් ප්‍රාග්ධනය සඳහා දායකත්වය	24	543,939,497	562,017,353
ප්‍රාග්ධන සංචිතය	25	767,029,766	767,029,765
ප්‍රත්‍යාගණන සංචිත	26	3,065,444	18,796,336
විකිණීම සඳහා තිබෙන මූල්‍ය වත්කම් සංචිතය		25,517,598	32,347,616
රඳවාගත් ඉපැයීම්		(180,035,051)	(440,520,030)
මුළු කොටස් ස්කන්ධය		**1,209,517,254**	**989,671,041**
ජංගම නොවන බැරකම්			
විශ්‍රාම ප්‍රතිලාභ බැඳියාවන්	27	20,341,572	18,315,468
මුළු ජංගම නොවන බැරකම්		**20,341,572**	**18,315,468**
ජංගම බැරකම්			
වෙළඳ හා වෙනත් ගෙවීම් නියමිත	28	793,180,578	874,692,411
ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත	29	99,242,700	69,154,628
උපචිත වියදම්	30	6,139,898	3,282,000
බැංකු අයිරා	31	4,131,842	
මුළු ජංගම බැරකම්		**902,695,018**	**947,129,039**
මුළු ස්කන්ධ හා බැරකම්		**2,132,553,844**	**1,955,115,548**

අංක 8 සිට 34 දක්වා පිටුවල ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යම කොටසක් නියෝජනය කරයි

මෙම මූල්‍ය ප්‍රකාශ, 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුකූලව පිළියෙල කරන ලදි.

අ/කලේ....................

මූල්‍ය කළමනාකරු
2015 ඔක්තෝම්බර් 19

මෙම මූල්‍ය ප්‍රකාශය පිළියෙල කොට ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය දරයි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් කරන ලදි.

....	....
අධ්‍යක්ෂ	අධ්‍යක්ෂ

.

සී.ස. ලංකා නැව් සංස්ථාව

කොටස් ආයෝජනයේ වෙනස් වීම් පිළිබද ප්‍රකාශ
2014 මාර්තු 31 දිනයෙන් අවසන් වූ වර්ෂය සඳහා

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	කොටස් ප්‍රාග් ප්‍රාග්ධනය සඳහා දායකත්වය	ප්‍රාග්ධන සංචිතය	ප්‍රත්‍යාගණන සංචිතය	විකිණීමට ඇති මූල්‍ය වත්කම්	රඳවාගත් ඉපැයීම්(හර)	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
2012 අප්‍රේල් 01 දිනට ශේෂය	50,000,000	575,541,087	767,029,765	18,796,336	38,715,726	(676,744,559)	773,338,355
වර්ෂය සඳහා (නැවත ප්‍රකාශිත)ලාභය (සටහන අ) - - - - -						215,899,765	215,899,765
අනෙකුත් සවිස්තරාත්මක ආදායම් - - - -					(6,368,110)	2,194,568	(4,173,542)
සම්පූර්ණයෙන් ක්ෂය ගතකල(නැවත ප්‍රකාශිත)වත්කම් - - - - -						10,934,089	10,934,089
ලැබූ ප්‍රදාන නැවත ගෙවීම් -		(13,523,734) - - - -					(13,523,734)
2013 මාර්තු 31 දිනට ශේෂය	**50,000,000**	**562,017,353**	**767,029,765**	**18,796,336**	**32,347,616**	**(447,716,137)**	**982,474,933**
ඉහත කාලපරිච්ඡේදයේ දෝෂ(සටහන ආ) - - - - -						7,196,107	7,196,107
2013 මාර්තු 31 දිනට ශේෂය(නැවත ප්‍රකාශිත)	**50,000,000**	**562,017,353**	**767,029,765**	**18,796,336**	**32,347,616**	**(440,520,030)**	**989,671,041**
ලැබූ ප්‍රදාන නැවත ගෙවීම් -		(18,077,856) - - -				3,583,252	(14,494,604)
යාත්‍රා අපහරණය කිරීමට අදාල ප්‍රත්‍යාගණන මුදල් - මාරුකිරීම් - - -				(15,730,892) -		15,730,892 -	
වර්ෂය සඳහා ලාභ - - - - -						250,477,673	250,477,673
ලාභාංශ - - - - -						(10,000,000)	(10,000,000)
අනෙකුත් සවිස්තරාත්මක ආදායම් - - - -					(6,830,018)	693,162	(6,136,856)
2014 මාර්තු 31 දිනට ශේෂය	**50,000,000**	**543,939,497**	**767,029,766**	**3,065,444**	**25,517,598**	**(180,035,051)**	**1,209,517,254**
	=======	========	========	=========	=========	=========	=========

පිටු අංක 8 සිට 34 දක්වා වූ ගිණුම් ප්‍රතිපත්ති හා සටහන්, මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යම කොටසක් නියෝජනය කරයි.

	රු.
පසුගිය වර්ෂයේදී විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව ලාභය	218,792,044
ඉහත කාලපරිච්ඡේදයේ දෝෂ	
ද්විත්වකරණය වූ අපචය ප්‍රතිපාදන නිවැරදි කිරීම	403,006
ඉහත වර්ෂයේ පොලී උපචිත නිවැරදි කිරීම	(233,916)
වියදම් වර්ගීකරණ නිවැරදි කිරීම	(876,563)
ජීවගණක උපකල්පන වෙනස්වීම් වලින් උද්ගත වූ ලැබීම්	(2,184,806)
වර්ෂය සඳහා ලාභ (නැවත ප්‍රකාශිත)	215,899,765

සටහන ආ

ඉහත කාලපරිච්ඡේදයේ දෝෂ

ආශ්‍රිත සමාගම්වල වෙනත් සවිස්තරාත්මක ආදායම් කොටස ඉහත වර්ෂයේදී සැලකිල්ලට නොගැනින.

සී/ස. ලංකා නැව් සංස්ථාව

මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2014	2013
	රු.	රු.
මෙහෙයුම් කටයුතු වලින් මුදල් ප්‍රවාහය		
බද්දට පෙර ලාභය	309,167,893	271,818,690
ගැලපුම් කිරීම්		
ක්ෂය වීම්	5,271,673	4,166,202
දේපළ පිරියත හා උපකරණ විකිණීමෙන් ලාභ	(110,772,648)	(710,043)
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	2,107,329	805,230
දේපළ පිරියත උපකරණ වල වටිනාකම හීනවීම ප්‍රතිපාදන		3,626,440
ලාභාංශ ආදායම	(559,914)	(337,959)
ආශ්‍රිත සමාගම් වල ලාභයේ කොටස(බදු ඇතුළුව)	(15,449,315)	(21,387,767)
ජීව ගණක උපකල්පන වෙනස්වීම්වලින් උද්ගතවන ලැබීම්	687,082	2,184,806
පොළී ආදායම	(38,851,992)	(39,447,836)
පොළී වියදම		42,574
ඉහත කාලසීමාවේ දෝෂ නිවැරදි කිරීම		707,473
කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම් වලට මෙහෙයුම් වියදම්	151,600,108	221,467,810
වට්ටෝරුගත භාණ්ඩ වැඩිවීම්/අඩුවීම්	1,688,254	(77,712)
වෙළඳ හා අනෙකුත් ලැබීම් නියමිත වැඩිවීම්	(62,015,338)	(384,202,200)
වෙළඳ හා අනෙකුත් ගෙවීම් නියමිත වැඩිවීම්/අඩුවීම්	(81,511,833)	231,915,962
ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත වැඩිවීම්/අඩුවීම්	15,382,723	(7,289,950)
උපචිත වියදම් වැඩිවීම	2,857,898	107,062
මෙහෙයුම් වලින් ජනිත මුදල්	28,001,812	61,920,972
පාරිතෝෂික ගෙවීම්	(81,226)	(4,431,630)
පොළිය ගෙවීම්		(42,574)
ගෙවූ බදු	(44,751,908)	(3,479,362)
මෙහෙයුම් වලදී භාවිතා කල/ජනිත මුදල්	(16,831,323)	53,967,406
ආයෝජන කටයුතු වලින් මුදල් ප්‍රවාහ		
නිශ්චිත දේපළ මිලදී ගැනීම්	(1,970,001)	(2,645,124)
නිශ්චල දේපළ විකිණීමෙන් ලත් මුදල්	157,905,840	736,241
කල්පිරීම් සහිත වත්කම් වල ආයෝජන	(407,803,742)	(145,363,635)
කල්පිරීම් සහිත මූල්‍ය වත්කම්වලින් ලැබුණු මුදල්	247,850,706	107,846,479
ලැබුණු පොළිය	19,661,782	13,348,605
ලාභාංශ ලැබීම්	1,418,612	667,540
මෙහෙයුම්වලදී(භාවිත/ජනිත ශුද්ධ මුදල්)	17,063,197	(25,409,894)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ		
ලැබුණු ප්‍රදාන නැවත ගෙවීම්	-	(13,523,734)
ගෙවූ ලාභාංශ	(10,000,000)	
මූල්‍ය කටයුතුවල යොදන ලද ශුද්ධ මුදල	(10,000,000)	(13,523,734)
මුදල් හා මුදල් සාම්‍යයන්හි ශුද්ධ අඩුවීම/වැඩිවීම	(9,768,125)	15,033,778
වර්ෂය මුලදී මුදල් හා මුදල් සාම්‍යයන්	73,186,620	58,152,842
වර්ෂය අවසානයේදී මුදල් හා මුදල් සාම්‍යයන්	63,418,495	73,186,620
	==========	============

පිටු අංක 8 සිට 34 දක්වා වූ ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශවල අවශ්‍යම කොටසක් නියෝජනය කරයි.

මූල්‍ය වාර්තාව සඳහා සටහන්

ගිණුම් කරණ ප්‍රතිපත්ති සහ පැහැදිලි කිරිමේ සටහන්

1. සාමාන්‍ය තොරතුරු

1.1 අස්ථිතිය හා නෛතික ආකෘතිය

ශ්‍රී ලංකාවේ පිහිටියා වූද 1992 වර්ෂයේදී ස්ථාපනය කරන ලද්දා වූද සී/ස ලංකා නැව් සංස්ථාව වූ කලී ලංකා නැව් සංස්ථාවට (CSC) අනුප්‍රාප්තික ආයතනයක් වන අතර මෙය 1971 අංක 11 දරණ ලංකා නැව් සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ආයතනයකි. මෙහි ලියාපදිංචි කාර්යාලය සහ ව්‍යාපාරික කටයුතු කිරීමේ ප්‍රධාන ස්ථානය කොළඹ රසික් ෆරීඩ් මාවතේ, යෝනක ඉස්ලාමීය සංස්කෘතික මධ්‍යස්තථාන ගොඩනැගිල්ලේ අංක 27 දරණ ස්ථානයේ පිහිටා තිබේ.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය නාවික ගමනාගමනයට අදාල කළමනාකරණය, නැව්වල හිමිකාරිත්වය දැරීම හා යාත්‍රා කුලියට දීම යනාදි සේවාවන් ඉටුකිරීම.

1.3 සේවකයින් සංඛ්‍යාව

2014 මාර්තු 31 දිනට මුළු සේවක සංඛ්‍යාව 125 ක් විය.

1.4 වාර්තිකිරීමේ දිනය

සමාගමේ මූල්‍ය වාර්තාකරණ දිනය මාර්තු 31 දිනෙන් අවසන් වන අතර ආශ්‍රිත සමාගම්වල මූල්‍ය වාර්තාකරණ කාලසීමාව දෙසැම්බර් 31 දිනෙන් අවසන් වේ. සමාගමේ වාර්තාකරණ කාලසීමාවේ අවසන් දිනය හා ආශ්‍රිත සමාගම්වල වාර්තා කිරීමේ අවසන් දිනයට කැපීපෙනෙන කිසියම් ගණුදෙනු වේ නම් සමාගම ඒවා තක්සේරු කරයි.

1.5 මූල්‍ය ප්‍රකාශ සඳහා අනුමැතිය

මෙම මූල්‍ය වාර්තා අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ 2015 ඔක්තෝම්බර් 19 දින නිකුත් කිරීමට බලය දෙන ලදි.

2. පිළියෙල කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශය

සමාගමේ සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, කොටස් ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ සටහන් යනාදිය වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව හා 2007 අංක 7 දරණ සමාගම් පනතේ නියමතාවන්ට අනුව පිළියෙල කරන ලදි.

2.2 ගණනය කිරීමේ පදනම

සාධාරණ මිල අනුව ගණනය කරන ලද විකිණීමට තිබෙන මූල්‍ය වත්කම් ගණයෙහි ලා සැලකෙන ලැයිස්තුගත ආයෝජන, දේපොල , පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීම් ඓතිහාසික පිරිවැය අනුව පිලියෙල කරන ලදි. මූල්‍ය ප්‍රකාශවලට බලපෑමක් ඇතිවන උද්ධමනකාරී සාධක වෙනුවෙන් සීරුමාරු කිරීම් නොකෙරින.

2.3 සංසන්දනාත්මක සංඛ්‍යා

වත්මන් වර්ෂයේ ඉදිරිපත් කිරීම්වලට අනුකූල වන අයුරු ඉහත වර්ෂයේ සංඛ්‍යා සහ ඡේද නැවත වර්ගීකරණය කරන ලදි.

2.4 කාර්යීය හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුලත් භාණ්ඩ විෂයන් මනිනු ලබන්නේ සමාගම ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරය තුල ව්‍යවහාර වන මුදල් ඒකක භාවිතා කිරීමෙනි. ශ්‍රී ලාංකා රුපියලේ ආසන්න අගයට වටයනු ලැබේ. සමාගමේ කාර්යීය හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් අනුව ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කෙරේ.

2.5 ඇස්තමේන්තු හා තීන්දු භාවිත කිරීම

ශ්‍රී ලංකා මූල්‍ය රෙගුලාසි ප්‍රමිති (SLFRS) අනුව මූල්‍ය ප්‍රකාශ පිලියෙල කිරීමේදී, ගිණුම් ප්‍රතිපත්ති මෙන්ම වත්කම් වගකීම් ආදායම් හා වියදම් පිළිබඳව වාර්තා වී ඇති ප්‍රමාණයන් කෙරෙහි බලපෑමක් ඇතිකෙරෙන අයුරින් කළමනාකාරිත්වය විසින් තීන්දු තීරණ හා උපකල්පනයන් සිදුකිරීම අවශ්‍ය වේ. නමුත් ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුවලින් වෙනස්විය හැකිය.

ඇස්තමේන්තු හා වැදගත් උපකල්පනයන් අඛණ්ඩව සමාලෝචනය කරනු ලැබේ. ගිණුම් ඇස්තමේන්තු සඳහා වන සංශෝධන ඇස්තමේන්තු සංශෝධනය කරනු ලබන කාලය තුල හඳුනාගනු ලැබේ.

2.6 වැදගත් අවැදගත් බව හා සමූහනය

සමාන භාණ්ඩ විෂයන්හි එක් එක් ද්‍රව්‍ය පංතිය වෙත වෙනම මූල්‍ය ප්‍රකාශවල දක්වා ඇත. අසමාන ස්වභාවයෙන් යුක්ත භාණ්ඩ විෂයන් හෝ කාර්ය කටයුතු නොවැදගත් එවන්නේ නම් වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

3. <u>කැපී පෙනෙන ගිණුම් ප්‍රතිපත්ති සම්පිණ්ඩනය</u>

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය රෙගුලාසි හා ප්‍රමිතිවලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ සමාගම විසින් පිලියෙල කරන ලදි. මෙකී මූල්‍ය ප්‍රකාශ පිලියෙල කිරීමේදී යොදාගන්නා ලද ප්‍රධාන ගිණුම් ප්‍රතිපත්ති පහත දක්වා ඇත. වෙනත් යම් ආකාරයකින් දක්වා නොමැත්තේ නම් සියළු වර්ෂයන්හිදි මෙම ප්‍රතිපත්ති අනවරතව යොදාගන්නා ලදි.

3.1 විදේශ ව්‍යාපාර මුදල් ගනුදෙනු/පරිවර්තන

ගණුදෙනුව සිදුවන දිනයේදී බලපවත්නා විදේශ විනිමය අනුපාතය අනුව විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කිරීම සිදුකෙරේ. විදේශ විනිමය අනුව වටිනාකම දැක්වෙන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් ගත්කල මූල්‍ය තත්ත්වය ප්‍රකාශිත දිනයේදී බලපැවැත්වෙන විදේශ විනිමය අනුපාතය අනුව ශ්‍රී ලංකා රුපියලට පරිවර්තනය කෙරේ. එකී පරිවර්තනයන්හිදි උද්ගතවන වෙනස්කම් ලාභ හෝ අලාභ ගිණුමේදී හඳුනා ගැනේ. ඓතිහාසික පිරිවැය පදනම යටතේ සඳහන් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් වටිනාකම අනුව වූ මූල්‍ය වත්කම් හා වගකීම් වල වටිනාකම ගණුදෙනුව සිදුවූ දිනයේ බලපැවැත්වූ විදේශ විනිමය අනුපාතය අනුව පරිවර්තනය කරන ලදි.

3.2 ආදායම් බදු වියදම්

වර්ෂය සඳහා වූ බදු වියදම්වලට ඇතුලත් වන්නේ වත්මන් හා විලම්බිත බදුය. ලාභය හෝ අලාභය කල බද්ද හඳුනා ගැනෙන අතර වෙනත් සවිස්තරාත්මක ආදායම් වශයෙන් සෘජුවම හඳුනා ගැනෙන ආදායම් හෝ වියදම් විෂයකට අදාල වන වෙනස්කමක් ඇතුලත් වන්නේ නැත.

(අ) ප්‍රවර්තන බදු

ප්‍රවර්තන බදු යනුවෙන් හැඳින්වෙන්නේ වර්ෂය සඳහා ගෙවීමට නියමිත බද්දට යටත් ආදායම වෙනුවෙන් ගෙවිය යුතු බද්දයි. වාර්තා කරන දිනයට බලාත්මක වන බදු අනුප්‍රමාණයන් සහ ඉහත වර්ෂය සම්බන්ධයෙන් ගෙවිය යුතු බද්දට වූ වෙනත් යම් සීරුමාරු කිරීම් මේ සඳහා අදාල කර ගනු ලැබේ.

2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන සහ ඉන් ඉක්බිතිව සංශෝධන ප්‍රකාරව සමාගමේ බදු බැඳියාව ගණනය කොට තිබේ.

(ආ) විලම්බිත බද්ද

මූල්‍ය ප්‍රකාශයන් තුල දැක්වෙන වත්කම් හා වගකීම්වල ඉදිරියට ගෙනයන වටිනාකම හා ඒවාට අනුරූප බදු පදනම් වල (තාවකාලික වෙනස්කම් වශයෙන් හඳුන්වනු ලබන) වෙනස මත විලම්බිත බද්ද හඳුනා ගැනේ. ඉදිරියේදී බද්දට යටත් ලාභය වැඩිවෙතැයි අපේක්ෂා කරන සියළු තාවකාලික වෙනස්කම් වෙනුවෙන් විලම්බිත බදු බැඳියාවන් හඳුනා ගනු ලැබේ. ඉදිරියේදී බද්දට යටත් ලාභය අඩුවෙතැයි අපේක්ෂිත සියළු තාවකාලික වෙනස්කම් සහ භාවිත නොකල බදු පාඩු හා බදු වාසි වෙනුවෙන් විලම්බිත බදු වත්කම් හඳුනා ගැනේ.

විලම්බිත බද්ද එක් එක් වාර්තා කිරීමේ දිනයට සමාලෝචනය කරනු ලබන අතර ඉදිරි බද්දට යටත් ලාභවල ප්‍රවර්තන තක්සේරුව පිළිබිඹු වන සේ සීරුමාරු කරනු ලැබේ. සීරුමාරු කිරීම් කිසිවක් වේ නම් ලාභ හෝ අලාභයන් තුල ඒවා හඳුනාගනු ලැබේ.

වාර්තාකිරීමේ අවසාන දිනයට බලාත්මකව පවත්නා බදු අනුප්‍රමාණ පදනම් කරගෙන හඳුනාගැනීමට ඇති හෝ විලම්බිත බදු බැඳියාවන් නිරවුල් කිරීම ඇතැයි අපේක්ෂා කරන කාලසීමාවන්හි බද්දට යටත් ලාභය/පාඩුව ට අදාල කරගැනීමට අපේක්ෂා කරනු ලබන බදු අනුප්‍රමාණ අනුව විලම්බිත බද්ද ගණනය කරනු ලැබේ.

<u>වත්කම් හා තක්සේරු කිරීමේ පදනම</u>

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල ප්‍රවර්තන වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබ ඇති වත්කම් වූ කලී සමාගමේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුල හඳුනා ගැනීමට අපේක්ෂිත වත්කම් හෝ වාර්තා කිරීමේ දඅන සිට අවුරුද්දක් තුල යන දෙකින් වඩාත් අඩුකාලසීමාවක් තුල හඳුනාගැනීමට තිබෙන ඒවාය. ප්‍රවර්තන වත්කම් හැරුනු විට, වත්කම් යනුවෙන් දැක්වෙන්නේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දින සිට අවුරුද්දකට වඩා රඳවා ගැනීමට අපේක්ෂිත ඒවාය.

3.3 දේපොල, පිරියත හා උපකරණ

(අ) <u>හඳුනා ගැනීම හා ගණනය කිරීම</u>

දේපොල, පිරියත හා උපකරණ සඳහන් කරනු ලබන්නේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල ප්‍රත්‍යාගණන වටිනාකම අනුව ඉදිරියට ගෙනගිය ඉඩම් හැර පිරිවැය අඩුකල සමුච්චිත ක්ෂයවීම් හා කිසියම් සමුච්චිත අපචය වටිනාකම් අනුවය. ඓතිහාසික පිරිවැයට ඇතුලත් වන්නේ දේපොල ඒවා පවතින ස්ථානයට රැගෙන ඒමේදී කළමනාකාරිත්වය විසින් ඒවා තමන්ට අදහස් කරන ආකාරයට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තත්ත්වයන් යටතේ දැරීමට සිදුවූ යම් පිරිවැයක් වේ නම් ඒවාද ඇතුළුව මූලිකව දැරූ පිරිවැයයි. තමන් විසින්ම ගොඩනගන ලද වත්කම්වලට ද්‍රව්‍ය සඳහා වැයවූ පිරිවැය සහ ඍජු කම්කරු පිරිවැය ඇතුලත් වේ.

විවිධ ප්‍රයෝජ්‍ය ආයුකාලයන් සහිත ප්‍රධාන අංග වලින් යම් දේපොලක්, පිරියත හෝ උපකරණ සමන්විත වේ නම් ඒවා වෙන් වෙන් දේපොල පිරියත හා උපකරණ සේ ගණන් ගනු ලැබේ.

(ආ) <u>අනුෂංගික වියදම්</u>

දේපොල, පිරියත හා උපකරණයක ඉදිරියට ගෙනයන වටිනාකමට එවැනි භාණ්ඩයක කොටසක් වෙනුවට යමක් ප්‍රතිස්ථාපනය කිරීමේදී ඊට වැයවන පිරිවැය ඇතුලත් කරන්නේ එයින් සමාගමට වර්ධනාවනත ප්‍රතිලාභයක් අත්වන බව අපේක්ෂා කරන විටදීය. ප්‍රතිස්ථාපනය කළ කොටසේ ඉදිරියට ගෙනයන වටිනාකම හඳුනා නොගැනේ. අනෙකුත් සියළු අලුත්වැඩියාකිරීම් සහ නඩත්තු සඳහා දැරූ වියදම් ඒවා දරණ ලද කාලසීමාවේ ලාභයට හෝ පාඩුවට අයපත් කෙරේ.

(ඇ) <u>ක්ෂය වීම්</u>

ඉඩම් ක්ෂයවීම් ගණනය නොකරනු ලැබේ. ක්ෂයවීම් ලාභයට හෝ පාඩුවට අයපත් කෙරෙන්නේ අනෙකුත් දේපොල, පිරියත හා උපකරණවල ඇස්තමේන්තු කල ප්‍රයෝජ්‍ය ආයුකාලයෙන් එකී විෂයන්හි අවශිෂ්ඨ අගයෙන් අඩුකොට වත්කම්වල_පිරිවැයට ඉඩදීම සඳහාය. මීට සෘජු රේඛා ක්‍රමය භාවිතා කෙරේ. දේපොල වල ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයුකාලය පහත දැක්වේ.

<u>වත්කම්</u>	<u>වර්ෂ</u>
ගොඩනැගිලි	20
යාත්‍රා	10
මෝටර් රථ	04 – 10
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	10
කාර්යාලීය උපකරණ හා පරිගණක	05
ස්ප්‍රෙඩර්	05

කිසියම් භාණ්ඩයක ක්ෂය වීම ගණනය කිරීම ආරම්භ වන්නේ එය පාවිච්චි කිරීමෙන් අනතුරුව විකිණීමට ඇති භාණ්ඩයක් සේ වර්ගීකරණය කළ දින සිට සහ එය හඳුනා නොගත් දින සිටය. වාර්තා කිරීමේ අවසාන දිනය වන විට කැපී පෙනෙන වෙනසක ඉඟියක් වේ නම් යෝග්‍යයයි සැලකෙන පරිදි වත්කමේ අවශේෂ වටිනාකම් ප්‍රයෝජ්‍ය ආයුකාල සහ ක්ෂය කිරීමේ ක්‍රම භාවිතමය අයුරින් සමාලෝචනය කොට සීරුමාරු කරනු ලැබේ.
සුදුස්සක් කොට බැහැර කිරීමේදී විකුණූ භාණ්ඩ විෂයේ ශුද්ධ නීයාදන ලැබීම් සහ ඉදිරියට ගෙනයන වටිනාකම ලාභ හෝ පාඩු තුල හඳුනාගැනෙන අතර “වෙනත් ආදායම්” හෝ “වෙනත් මෙහෙයුම් වියදම් වල”ඇතුලත් කෙරේ.

3.4 ස්පර්ශනීය නොවන වත්කම්

අත්පත් කර ගන්නා ලද පරිගණක මෘදුකාංග පාවිච්චියට සරිලන අයුරු විශේෂිත මෘදුකාංග හා ක්‍රම පද්ධති පිහිටුවීම සඳහා දරණ ලද පිරිවැය පදනම් කරගෙන ඒවා ප්‍රාග්ධනීකරණය කෙරේ. අත්පත් කරගත් එවැනි වත්කම් සම්බන්ධයෙන් ගත්කල ඒවායේ පිරිවැය සමුච්චිත ක්‍රමක්ෂය හා සමුච්චිත අපචය පාඩු අඩුකිරීමෙන් පසුව සඳහන් කෙරේ. මෙකී පිරිවැය ඒවායේ ප්‍රයෝජ්‍ය ආයුකාලය අනුව පහත සඳහන් පරිදි ක්‍රමක්ෂය කෙරේ.

පරිගණක මෘදුකාංග අවුරුදු 05
පරිගණක මෘදුකාංග නඩත්තු කිරීමේ සේවාවන් ආශ්‍රිත පිරිවැය දැරූ වියදමක් ලෙස හඳුනා ගැනේ.

3.6 <u>විකිණීමට තිබෙන ජංගම නොවන වත්කම්</u>

ජංගම නොවන වත්කම් පාවිච්චි කිරීමට වඩා ඒවායේ ඉදිරියට ගෙනයන වටිනාකම් ඒවා මූලික වශයෙන් විකිණීමෙන් ලබාගත හැකිවන්නේ නම් සමාගම විසින් ඒවා ජංගම නොවන වත්කම් වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ. විකණීමට තිබෙන ජංගම වත්කම් මනිනු ලබන්නේ ඒවා විකිණීමට වැයවන පිරිවැය අඩුකිරීමෙන් පසු ඒවායේ ඉදිරියට ගෙන යන වටිනාකම සහ සාධාරණ අගය අනුවය. විකිණීමට තිබෙන යන වර්ගීකරණය සඳහා වූ නිර්ණායකය සපුරා ඇති බව සැලකෙන්නේ විකිණීම අතිශයින්ම සම්භාවිත එකක්ත වීම සහ වත්කම් පවතින ස්වභාවයෙන් වහා විකිණීම සඳහා පැවතීම යන කරුණුය. කළමනාකරිත්වය විසින් විකිණීමේ ක්‍රියාව සඳහා කැපවිය යුතු අතර විකිණීම සඳහා වර්ගීකරණය සිදුකොට වර්ෂයක් තුලදී එය අංග සම්පූර්ණ විකුණුම් ක්‍රියාවක් ලෙස හඳුනා ගැනීමට සුදුසුකම් ලබා තිබිය යුතුය.

අයිතිකරුවන්ට විකිණීමට/බෙදාදීමට යනුවෙන් වර්ගකොට ඇති දේපොල, පිරියත හා උපකරණ සඳහා ක්ෂයවීම් හෝ ක්‍රමක්ෂය සිදු නොකෙරේ.

3.7 මූල්‍ය නොවන වත්කම් අපවය වීම

එක් එක් වාර්තාකිරීමේ අවසන් දිනයට මූල්‍ය වත්කම් වල කිසියම් අපවය වීමක් සිදුවී ඇත්දැයි යන්න දැනගැනීම පිණිස සමාගම විසින් ඒවා සමාලෝචනය කරයි. එවැනි අපවය වීමක් සිදුවිය හැකි බවට ඉඟියක් වේ නම් එවැන්නක් සිදුවී ඇති වත්කමෙන් (හෝ ආශ්‍රිත භාණ්ඩ සමූහය) අයකරගත හැකි මුදල ඇස්තමේන්තු කොට එහි ඉදිරියට ගෙනයන වටිනාකම සමඟ සසඳනු ලැබේ. අයකරගත හැකි මුදල අඩුනම් ඉදිරියට ගෙනයන වටිනාකම, එහි ඇස්තමේන්තුකල අයකරගැනීමේ මුදලට අඩුකොට, අපවය පාඩුව වහාම ලාභ හෝ පාඩු තුල හඳුනා ගැනේ.

මීට සමානව සෑම වාර්තාකිරීමේ දිනය වන විට එක් එක් වට්ටෝරුගත භාණ්ඩ (හෝ භාණ්ඩ සමූහය) ඒවායේ විකුණුම් මිල සමඟ, (සැසඳීම හා විකිණීම සඳහා දරණ ලද පිරිවැය අඩුකොට), ඒවායේ ඉදිරියට ගෙනයන වටිනාකම සමග සසඳමින් අපවය වීම් සැලකිල්ලට ගෙන තක්සේරු කරනු ලැබේ.

කිසියම් වට්ටෝරුගත භාණ්ඩයක් (හෝ එවැනි භාණ්ඩ සමූහයක්) අපවය වී ඇත්නම් විකිණීමේ පිරිවැය අඩුකොට, එහි ඉදිරියට ගෙනයන වටිනාකම විකිණීමේ මිලට අඩුකරනු ලබන අතර ඉන් ඉක්බිතිව ලාභ හෝ පාඩු තුල හඳුනා ගැනීමට කටයුතු කෙරේ.

අපවය පාඩුවක් ඉන්පසුව ප්‍රතිවර්තනය වේ නම්, වත්කමේ (හෝ ආශ්‍රිත වත්කම් සමූහයේ) ඉදිරියට ගෙනයන වටිනාකම එහි අයකරගත හැකි සංශෝධිත වටිනාකමට (වට්ටෝරුගත භාණ්ඩ සම්බන්ධයෙන් නම් ඒවා සම්පූර්ණයෙන් විකුණා දැමීමේ පිරිවැය අඩුකොට) ඉහල නංවනු ලැබේ. එහෙත් එය ඉකුත් අවුරුදුවල, එකී වත්කම (හෝ ආශ්‍රිත වත්කම් සමූහය) සම්බන්ධයෙන් අපවය පාඩුවක් සිදුනොවූ අවස්ථාවක තීරණය කිරීමට ඉඩතිබූ වටිනාකමට වැඩි නොවිය යුතුය. අපවය පාඩුවක ප්‍රතිවර්තනය ලාභ හෝ පාඩු තුල ඉක්බිතිව හඳුනා ගැනේ.

3.8 වට්ටෝරුගත භාණ්ඩ

වට්ටෝරුගත භාණ්ඩවල අගය, යල්පැනගිය සහ අඩුවෙන් පාවිච්චිවන භාණ්ඩ විෂයන් වෙනුවෙන් සුදුසු ප්‍රතිභාග සැලසීමෙන් පසු අඩු පිරිවැයක් සහ ශුද්ධ, හඳුනාගත හැකි වටිනාකම අනුව අගයනු ලැබේ. පිරිවැය තීරණය කෙරෙන්නේ බරතැබූ සාමාන්‍ය ක්‍රමය අනුවය. වට්ටෝරුගත භාණ්ඩවලට පරිභෝජන ද්‍රව්‍ය ඇතුලත් වේ.

3.9 මූල්‍ය උපකරණ

මූල්‍ය වත්කම්

සමාගම විසින් තම මූල්‍ය වත්කම්, ප්‍රාරම්භක හඳුනාගැනීම මත වර්ගීකරණය කිරීමට තීරණය කරනු ලබන අතර එකී මූල්‍ය වත්කම් පහත දැක්වෙන අයුරු වර්ග කරයි.

(අ) වර්ගීකරණය

(i) ණය සහ ලැබීම් නියමිත

ණය සහ ලැබීම් නියමිත යනු සක්‍රීය වෙළඳපොලේ ලැයිස්තුගත නොවූ ස්ථිර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්ය. වාර්තාකිරීමේ දිනය අවසාන වීමේ සිට මාස 12 කට වඩා වැඩි කාලසීමාවක් සඳහා ප්‍රවර්තන නොවන වත්කම් සේ වර්ග කොට ඇති කල්පිරීම් ආයෝජන හැර ණය සහ ලැබීම් නියමිත ප්‍රවර්තන වත්කම්වල ඇතුලත් කෙරේ. සමාගමේ ණය සහ ලැබීම් නියමිත වලට අඩංගු වන්නේ වාර්තාකාරීමේ කාලසීමාවේ අවසානයට ඇති වෙළඳ හා වෙනත් ලැබීම් නියමිත, කාලීන තැන්පතු ආයෝජන, තැන්පතු හා අත්තිකාරම්, මුදල් හා මුදල් සාම්‍යයන් යන ඒවාය.

(ii) විකිණීමට ඇති මූල්‍ය වත්කම්

විකිණීමට ඇති මූල්‍ය වත්කම් වූ කලී මෙම ගණය යටතේ නම් කරන ලද ව්‍යුත්පන්න නොවන භාණ්ඩ විෂයයන් හෝ වෙනත් ගණයන් යටතේ වර්ගීකරණය නොකරන ලද ඒවා වේ. වාර්තාකිරීමේ අවසන් දිනයේ සිට මාස 12 ක් ඇතුලත අපහරණය කිරීමට සමාගම අපේක්ෂා නොකරන්නේ නම් හෝ අයෝජනයට කල්නොපිරේනම් එම වත්කම් ප්‍රවර්තන නොවන ප්‍රවර්තන නොවන වත්කම්වලට ඇතුලත් කෙරේ. විකිණීමට ඇති මූල්‍ය වත්කම් දිගුකාලීන ලැයිස්තුගත සහ ලැයිස්තුගත නොවූ කොටස් ආයෝජන වලින් සමන්විත වේ.

(iii) කල්පිරීම් ආයෝජන වූ කලී ස්ථිර හෝ නිගමනය කළ හැකි ගෙවීම් හා ස්ථිර කල්පිරීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වන අතර ණය හා ලැබීම් නියමිත ඊට ඇතුලත් නැත. කල්පිරෙන තෙක් එකී ආයෝජන එසේ රඳවා තැබීම සඳහා සමාගමට සාධනීය අපේක්ෂාවක් හෝ හැකියාවක් තිබේ නම්, එම ආයෝජන කල්පිරීම් සඳහා රඳවා තැබූ ආයෝජන සේ වර්ග කෙරේ. අවුරුද්දකට වඩා කල් නොපිරේ නම් කල්පිරීම සඳහා රැඳවූ ආයෝජන ප්‍රවර්තන වත්කම්වලට ඇතුලත් කෙරේ.

(ආ) <u>හඳුනාගැනීම හා ප්‍රාරම්භක මැන බැලීම්</u>

සමාගම විසින් ගණුදෙනු ආරම්භකරන දිනයේ සිට ණය සහ අනෙකුත් ලැබීම් නියමිත වශයෙන් මූල්‍ය වත්කම් හඳුනා ගැනේ. මූල්‍ය උපකරණ කොන්ත්‍රාත්තුමය ප්‍රතිපාදනයට සමාගම පාර්ශවයක් වන වෙළඳ දිනයේ සිට අනෙකුත් මූල්‍ය වත්කම් හඳුනා ගනු ලැබේ. මූලික වශයෙන් මූල්‍ය වත්කමක් සාධාරණ මිල අනුව මනිනු ලබන අතර, ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම අනුව හඳුනාගනු නොලබන වත්කම් සම්බන්ධයෙන් ඍජුවම ගනුදෙනු පිරිවැය හඳුනාගනු ලැබේ. මූල්‍ය වත්කමෙන් ජනිත වන මුදල් ප්‍රවාහයන් ලබා ගැනීමට තිබෙන හිමිකම් ඉකුත්වන විට හෝ එකී හිමිකම් වෙනත් පාර්ශවයකට පවරන විට සමාගම සත්‍ය ලෙස ඒවායේ හිමිකාරිත්වයට අදාල වන සියළු අවදානම් හා ප්‍රතිලාභ සත්‍ය වශයෙන්ම පවරාදෙනු ලබන විට මූල්‍ය වත්කම් ප්‍රතිපාදන හඳුනා ගැනීමක් සිදුකෙරේ

(ඇ) <u>පසුව ගණනය කිරීම</u>

(i) ණය සහ ලැබීම් නියමිත

ප්‍රාරම්භක හඳුනාගැනීමෙන් ඉක්බිතිව, ණය හා ලැබීම් නියමිත සඵල පොලී අනුපාත ක්‍රමය යොදාගනිමින් අපවය සඳහා වූ ප්‍රතිපාදන අඩුකොට, ක්‍රමක්ෂය පිරිවැය යටතේ මැන බලනු ලැබේ.

(ii) විකිණීමට ඇති මූල්‍ය වත්කම්

ප්‍රාරම්භක හඳුනාගැනීමෙන් පසුව, විකිණීමට ඇති මූල්‍ය වත්කම් ලෙස වර්ග කොට ඇති ලැයිස්තුගත කොටස් ආයෝජන සාධාරණ මිල අනුව මැන බලනු ලැබේ. විකිණීමට ඇති මූල්‍ය වත්කම්වල මිලෙහි සාධාරණ අගය පිළිබඳ වෙනස්කම් වෙනත් සවිස්තරාත්මක ආදායම් තුල හඳුනාගෙන කොටස් ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය තුල විකිණීමට ඇති සංචිතය ලෙස ඉදිරිපත් කෙරේ. ලැයිස්තුගත නොවූ කොටස්

ආයෝජන ප්‍රවර්තන කාලයේදී විශ්වාසදායක අයුරින් ඒවායේ සාධාරණ අගය තක්සේරු කළ නොහැකි බැවින් අපවය පාඩු කිසිවක් වේ නම් ඒවාද අඩුකොට පිරිවැය අනුව ගණනය කරනු ලැබේ

(iii) කල්පිරීම සඳහා රඳවාගත් ආයෝජන

කල්පිරීම් ආයෝජන සඵල පොලී අනුපාතය භාවිත කරමින් ක්‍රමක්ෂය පිරිවැය අනුව ගණනය කෙරේ. අත්පත් කර ගැනීම් හා ගණුදෙනු පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලැබේ.

(ඇ) මූල්‍ය වත්කම් අපවය වීම

(i) ක්‍රමක්ෂය පිරිවැය අනුව ඉදිරියට ගෙනයන වත්කම්

එක් එක් වාර්තාකිරීමේ කාලසීමාව අවසානයේදී කිසියම් මූල්‍ය වත්කමක් අපවය වී ඇති බවට විෂය මූලික සාක්ෂි තිබේදැයි තක්සේරු කෙරේ. මූල්‍ය වත්කමක් සම්බන්ධයෙන් අපවය පාඩු සිදුවන්නේ වත්කම ප්‍රාරම්භකව හඳුනාගැනීමෙන් පසුව සිදුවීමක් හෝ සිදුවීම් ගණනාවක් හේතුවෙන් සිදුවී ඇති අපවය වීමක් විෂය මූලික සාක්ෂි ඇතිනම් හා සහතික වශයෙන් ඇස්තමේන්තු කළ හැකි මූල්‍ය වත්කමේ ඇස්තමේන්තු කරන ලද අනාගත මුදල් ප්‍රවාහයන්ට එකී පාඩුවෙන් බලපෑමක් ඇතිවන්නේ නම් පමණි.

ක්‍රමක්ෂය පිරිවැය අනුව ඉදිරියට ගෙනයනු ලබන ණය සහ ලැබීම් නියමිත සම්බන්ධයෙන් පාඩු මනිනු ලබන්නේ වත්කමේ ඉදිරියට ගෙනයනු ලබන වටිනාකම සහ මූල්‍ය වත්කමේ ප්‍රවර්තන සඵලදායි පොලී අනුපාතය අනුව වට්ටනම් කරන ලද ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි (නොදැරූ අනාගත ණය පාඩු හැර) ප්‍රවර්තන අගය අතර ඇති වෙනසයි. මූල්‍ය වත්කමේ ඉදිරියට ගෙනයන වටිනාකම අඩුකරනු ලබන අතර පාඩු වූ මුදල සවිස්තර ආදායම් ප්‍රකාශය තුල හඳුනා ගැනේ. ඉක්බිතිව එළඹෙන කාල පරිච්ඡේදයකදී අපවය පාඩුව අඩුවේ නම් හා අපවය හඳුනාගැනීමෙන් පසුව සිදුවූ කාරණාවකට එම අඩුවීම විෂය මූලික සම්බන්ධතාවක් දක්වයි නම් කලින් හඳුනාගත් අපවය පාඩුවේ වෙනස්වීම් සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය තුල හඳුනා ගැනේ. එබඳු අපවය පාඩු ප්‍රතිවර්තනය නොකෙරේ.

3.9.1 වෙළඳ හා අනෙකුත් ලැබීම් නියමිත

වෙළඳ හා අනෙකුත් ලැබීම් නියමිත මූලිකව ගණුදෙනු මිල අනුව හඳුනාගනු ලැබේ. ලැබීම් නියමිත පොලියක් නොදරන විට සහ ලැබිය යුතු මුදල් (වට්ටම් නොකළ) පදනම් කරගෙන තක්සේරු කරන තන්හිදී සාමාන්‍ය ණය කොන්දේසි යටතේ බොහෝ විකුණුම් සිදුකෙරේ. සාමාන්‍ය ණය කාලසීමාවන්ට වඩා ණය දිගුකෙරෙන විට ලැබීම් නියමිත, ක්‍රමක්ෂය පිරිවැය අනුව මැන බලන අතර ඊට යොදාගනු ලබන්නේ සඵල පොලී අනුපාතයයි. වාර්තාකිරීමේ අවසාන දිනයට වෙළඳ මා ලැබීම් නියමිත වල ඉදිරියට ගෙනයන වටිනාකම(ලැබිය යුතු මුදල් ප්‍රමාණයන් ආපසු අයකර ගැනීමට නොහැකි වන බවට විෂය මූලික සාක්ෂියක් තිබේදැයි තීරණය කිරීම පිණිස) සමාලෝචනය කරනු ලැබේ. එසේ නම්, අපවය පාඩුව ලාභ සහ අලාභය තුල ඉක්බිතිව හඳුනා ගැනේ.

3.9.2 මුදල් හා මුදල් සාම්‍යයන්

මුදල් හා මුදල් සාම්‍යයන්ට ඇතුලත් වන්නේ අත ඇති මුදල් ඉල්ලූ විටක ගත හැකි තැන්පතු සහ මූලිකව මාස තුනකට වඩා හෝ ඊට අඩු කල්පිරීම් සහිත ඉහල ද්‍රවශීලතාවයෙන් යුක්ත අනෙකුත් කෙටිකාලීන ආයෝජනයන්ය. මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල ප්‍රවර්තන වගකීම් වල බැංකු අයිරා සඳහන් කෙරේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය "වක්‍ර ක්‍රමය" භාවිත කරමින් පිළියෙල කොට තිබේ.

<u>**මූල්‍ය වගකීම්**</u>

3.9.3 වෙළඳ හා අනෙකුත් ගෙවීම් නියමිත

වෙළඳ හා අනෙකුත් ගෙවීම් නියමිත මූලික වශයෙන් ගණුදෙනු පිරිවැය ඇතුලත්ව ගනුදෙනු මිල යටතේ හඳුනාගනු ලැබේ. වෙළඳ ගෙවීම් නියමිත වූ කලී සාමාන්‍ය ණය නියමයන් වත වූ ඉටුකරන බැඳියාවන් වන අතර ඒවාට පොලිය අඩංගු නොවේ. සඵල පොලී අනුපාත ක්‍රමය යොදාගනිමින් ඉක්බිතිව පොලී සහිත වගකීම් ක්‍රමක්ෂය පිරිවැය අනුව මැන බැලීම සිදු කෙරේ.

3.9.4 බැංකු අයිරා

බැංකු අයිරා ඉල්ලුවිටක ගෙවිය යුතු ඒවා වන අතර මූලිකව මැනබලා ඉක්බිතිව මුහුණත වටිනාකම අනුව සඳහන් කරනු ලැබේ.

3.10 රජයේ ප්‍රදාන

ප්‍රදාන ලැබෙන බවට සැලකිය යුතු සහතිකයක් තිබේනම් සහ සමාගම විසින් ඊට අදාල කොන්දේසිවලට අනුව කටයුතු කරන්නේ නම් මුදල් නොවන ප්‍රදාන ඇතුළුව රජයෙන් ලැබෙන ප්‍රදාන ඒවායේ සාධාරණ මිල අනුව හඳුනා ගැනේ.

දේපොල පිරියත හා උපකරණ සම්බන්ධයෙන් රජයෙන් ලැබෙන ප්‍රදාන විලම්බිත ප්‍රදාන ලෙසින් ජංගම නොවන වගකීම් වල ඇතුලත් කෙරෙන අතර අදාල වත්කම්වල අපේක්ෂිත ආයුකාලය මත සෘජුරේඛා පදනමින් සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය තුල හඳුනා ගැනේ.

මුදල් නොවන ප්‍රදාන ඒවායේ ඉදිරියට ගෙනයන වටිනාකම අනුව අගයනු ලබන අතර ඉදිරියට ගෙනයන වටිනාකම අනුව ප්‍රදාන හා වත්කම් ලෙස ගිණුම්ගත කෙරේ.

වගකීම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්ත්ව ප්‍රකාශ තුල ප්‍රවර්තන වගකීම් ලෙස වර්ගීකරණය කරනු ලැබ ඇති බැඳියාවන් වාර්තාකිරීමේ දින සිට වර්ෂයක් ඇතුලත ගෙවීමට නියමිත හෝ ඉල්ලුවිටක ගෙවීමට තිබෙන ඒවාය. ජංගම නොවන බැඳියාවන් වූ කලී වාර්තාකිරීමේ දින සිට අවුරුද්දකින් පසුව ගෙවීමට තිබෙන ශේෂයන්ය.

මෙකී මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී, දන්නා ලද සියලු බැඳියාවන් ගිණුම්ගත කරනු ලැබ තිබේ. පසුගිය සිද්ධිවල ප්‍රතිඵලයක් වශයෙන් සාධනීය බැඳියාවන් හෝ නෛතික බැඳියාවන් සමාගමට ඇති විට ප්‍රතිපාදන හා බැඳියාවන් හඳුනාගනු ලැබෙන අතර බැඳියාවන් ඉටුකිරීම සඳහා ඇතැම්විට ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලනය වීමක් ඇතිවිය හැකිය.

3.11 විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය

සමාගම සතුව නිශ්චිත ප්‍රතිලාභ මෙන්ම නිශ්චිත දායකත්ව සැලසුම් තිබේ. නිශ්චිත දායකත්ව සැලැස්ම යනු විශ්‍රාම සැලැස්මක් වන අතර, වෙනමම ආයතනයක් සඳහා සමාගම නිශ්චිත දායකත්වයක් සිදුකරයි. එහෙත් සමාගම සතුව ප්‍රමාණවත් අරමුදල්, ප්‍රවර්තන හා පෙර කාලසීමා වෙනුවෙන් සේවකයින්ගේ සේවා වෙනුවෙන් ප්‍රතිලාභ ගෙවීමට නොමැති විට ඒ සඳහා සම්මුතික හා නෛතික වශයෙන් සමාගම වගකීමෙන් බැඳී නැත.

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම විශ්‍රාම සැලසුමක් වන අතර නිශ්චිත දායක්තව සැලසුමක් නොවේ. සාමාන්‍ය පරිදි විශ්‍රාම යාමේදී සේවකයෙකුට ලැබෙන නිශ්චිත මුදල කුමක්දැයි නිශ්චිත ප්‍රතිලාභ අරමුදලින් හැඳින්වේ. එය වයස, සේවා කාලය හා වන්දි මුදල මත තීරණය වේ.

(අ) නිශ්චිත දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල (EPF)

- සේවක භාර අරමුදල (ETF)

සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාර අරමුදලට සුදුසුකම් ලබන සියළු සේවකයින් ඒ ඒ ව්‍යවස්ථා සහ රෙගුලාසි අනුව අදාල දායකත්ව අරමුදල් වලින් ආවරණය වේ.

(ආ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - විශ්‍රාම පාරිතෝෂික

විශ්‍රාම පාරිතෝෂික සම්බන්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල හඳුනාගෙන ඇති වගකීම් වනාහි වාර්තාකිරීමේ දිනය වනවිට පවතින පාරිතෝෂික බැඳියාවන්හි වටිනාකමයි. පාරිතෝෂිකය ගණනය කිරීමේ සූත්‍රයට අනුව ප්‍රතික්ෂේප ඒකක බැර ක්‍රමය භාවිතා කරමින් පාරිතෝෂික බැඳියාවන් මනිනු ලැබේ.

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනතට අනුව අවුරුදු 5ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණකොට විශ්‍රාම යන සේවකයින්ට පමණක් පාරිතෝෂික ගෙවීමට සමාගම බැඳී සිටි.

වෙනත් සවිස්තරාත්මක ආදායම් තුල ජීවගණක ලැබීම්/පාඩු ඒවා සිදුවූ කාලසීමාව අනුව හඳුනා ගැනේ.
පාරිතෝෂිකයට බාහිර වශයෙන් මුදල් සම්පාදනය නොකෙරේ.

3.12 හදිසි අවස්ථා සහ ප්‍රාග්ධන බැඳියාවන්

වාර්තාකරන දිනය වන විට පවත්නා ද්‍රව්‍යමය බැඳියාවන් හා ආපතික වගකීම් මූල්‍ය ප්‍රකාශ වල ඒ ඒ සටහන් වලින් හෙලිදරව් කෙරේ.

සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය

3.13 ආදායම හඳුනාගැනීම

සමාගමට ආර්ථික ප්‍රතිලාභ ලැබීම සහ දැරීමට ඇති ආදායම හා ආශ්‍රිත වියදම් විශ්වාසදායක ලෙස මැණිය හැකි විමසීම සම්භාවී වන තරමට ආදායම හඳුනා ගැනේ. ලැබීමට ඇති හා ලැබූ ප්‍රති ශාඛාවේ සාධාරණ මිල අනුව ආදායම මනිනු ලැබේ.

(අ) **යාත්‍රා ආදායම**

නැව්බඩු මෙහෙයුම් කටයුතු වලින් හා ප්‍රවාහන සේවාවලින් උත්පාදනය වන ආදායම සේවාවන් සම්පූර්ණයෙන් ඉටුකිරීමේ පදනම මත ඒවා සපයන ලද කාලසීමා තුලදී හඳුනා ගැනෙන අතර නම්‍ය වශයෙන්ම සපයන ලද සේවා පදනම අනුව තක්සේරු කරනු ලැබේ.

<u>නැව්කුලී ආදායම</u>

කාල පදනමක් මත කුලියට දීමෙන් ලැබෙන ආදායම කුලී ගිවිසුම් කාලය පදනම් කරගෙන උපචිත පදනම හඳුනාගනු ලැබේ.

(ඇ) නියෝජ්‍යායතන ගාස්තු

සේවාවන් සම්පූර්ණ කිරීමේ පදනම මත, සේවාවන් සැපයූ කාලය අනුව නියෝජ්‍යායතන ගාස්තු හඳුනා ගනු ලැබේ.

(ඈ) පොලිය

සඵල පොලී ක්‍රමය යොදාගනිමින් පොලී ආදායම හඳුනාගනු ලැබේ.

(ඉ) වෙනත් ලැබීම් හා පාඩු

ආයෝජන ඇතුළු දේපොල, පිරියත හා උපකරණ හා අනෙකුත් ජංගම නොවන වත්කම් විකිණීමෙන් ලැබෙන ආදායම් සම්භාවයේ ශුද්ධ ලැබීම් සහ පාඩු ලාභ සහ පාඩු වෙනුවෙන් ගිණුම්ගත කෙරෙන්නේ ඒ වයේ ඉදිරියට ගෙනයන වටිනාකම හා ආශ්‍රිත විකුණුම් වියදම් විකිණීමෙන් ලත් මුදලින් අඩුකිරීමෙන් ඉක්ඉබිතිවය.

(ඊ) **ලාභාංශ ආදායම**

ගෙවීම් ලැබීම් සඳහා වූ අයිතිය තහවුරු වූ පසු ලාභාංශ ආදායම හඳුනාගනු ලැබේ.

3.14 **<u>වැය හඳුනාගැනීම</u>**

කාර්යක්ෂමව ව්‍යාපාරය පවත්වා ගැනීම සහ දේපොල, පිරියත හා උපකරණ නඩත්තු කිරීම සඳහා දැරූ සියළු වියදම් වර්ෂය සඳහා වූ ලාභය හෝ පාඩුව ගණනය කිරීමේදී ආදායමට අයපත් කොට තිබේ.

3.15 **<u>ණයට ගැනුම් පිරිවැය</u>**

ණයට ගැනුම් දැරූ කාලය තුලවූ වියදම් සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය තුල හඳුනා ගැනේ.

3.16 **<u>ආශ්‍රිත පාර්ශව ගනුදෙනු</u>**

අයකරනු ලබන ගාස්තු පිළිබඳව තැකීමක් නොකොට මූල්‍ය හා මෙහෙයුම් තීරණ/ප්‍රතිපත්ති මත කැපීපෙනෙන පාලනයක් හෝ බලපෑමක් ඇති කිරීම සඳහා එක් පාර්ශවයකට හැකියාව ලැබෙන ගනුදෙනු සම්බන්ධයෙන් හෙලිදරව් කිරීම් සිදුකොට තිබේ.

3.17 **<u>නිකුත් කරනු ලැබ ඇති එහෙත් බලාත්මක නොවූ ප්‍රමිති</u>**

සමාගමේ මූල්‍ය ප්‍රකාශ නිකුත් කරන ලද දිනට නිකුත්කරන ලද එහෙත් බලාත්මක නොවූ ප්‍රමිති පහත දක්වා ඇත. මෙකී ප්‍රමිති බලාත්මක වීමෙන් පසුව ක්‍රියාවේ යෙදැවීමට සමාගම බලාපොරොත්තු වේ. එකී ප්‍රමිති පහත දැක්වෙන පරිදි වේ.

SLFRS – 9 මූල්‍ය උපකරණ: වර්ගීකරණය හා මැනීම්

2015 ජනවාරි 01 දින හෝ ඉන්පසුව ආරම්භවන වාර්ෂික කාලය සඳහා මෙම ප්‍රමිතිය මුලින් වලංගුව පැවතුනි. කෙසේ නමුත් පසුව එය බලාත්මක වන කාලය වෙනස් වූ අතර එය සඵලතාවයට පත්වන සංශෝධිත දිනය ඉදිරියේදී ප්‍රකාශයට පත්කිරීමට නියමිතය. ඉහත කාරණයට අමතර වශයෙන් පහත දැක්වෙන ප්‍රමිතීන්ද නිකුත්

කරනු ලැබ තිබෙන අතර 2014 ජනවාරි 01 හෝ ඉන්පසුව ආරම්භවන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා යොදාගනු ලැබේ.

SLFRS 10 - ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ
SLFRS 11 - සංයුක්ත විධිවිධාන
SLFRS 12 - අනෙකුත් පිවිසුම්වල පොලිය හෙලිදරව් කිරීම
SLFRS 13 - සාධාරණ අගය මැනීම්

සිදුකරන ලද ප්‍රාථමික විශ්ලේෂණ පදනම් කරගත් කල යථෝක්ත අයුරින් යොදාගන්නා ලද ප්‍රමිතීන් තුලින් මූල්‍ය ප්‍රකාශ කෙරෙහි කිසිදු වැදගත් බලපෑමක් වෙතැයි අපේක්ෂා නොකෙරේ.

මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

	සටහන්	**2014**	**2013**
		රු.	රු.
4. ආදායම			
යාත්‍රා ආදායම		231,166,218	527,424,949
කුලී ආදායම		5,344,165	47,801,910
නැව්බඩු යැවීම හා නිශ්කාෂණ ආදායම		33,817,211	30,986,034
නියෝජිත ගාස්තු හා කොමිස්		256,491,094	141,557,778
වෙනත් සේවා			102,962,015
		526,818,688	850,732,686
5. වෙනත් ආදායම්			
ලාභාංශ		559,914	337,959
දේපළ පිරියත හා උපකරණ විකිණීමෙන් ලාභ		110,772,648	710,043
ශුද්ධ විනිමය ලැබීම්		27,624,055	45,252,357
කළමනාකරණ ගාස්තු-ලංකා විදුලිබල මණ්ඩලය බෝට්ටු හා බත්තල්		12,847,274	
වෙනත්		5,120,783	1,917,848
		156,924,674	48,218,207
6. මෙහෙයුම් වලින් ලාභ			
පහත දැක්වෙන දෑ ඇතුළුව වියදම් අයපත් කිරීමෙන් පසුව මෙහෙයුම් ලාභය සඳහන් කොට තිබේ.			
අධ්‍යක්ෂ වරුන්ගේ පඩිනඩි		1,068,000	1,974,194
විගණකවරුන්ගේ පඩිනඩි		404,800	859,000
ක්ෂය වීම්		5,271,673	4,166,202
නිශ්චිත දායකත්ව සැලසුම් පිරිවැය= EPF/ETF		9,387,046	8,605,968
නිශ්චිත දායකත්ව සැලසුම් පිරිවැය-විශ්‍රාම පාරිතෝෂික		2,107,329	805,230
කාර්ය මණ්ඩල පිරිවැය		90,976,594	78,434,192
වෘත්තීය හා නෛතික ගාස්තු		7,581,834	7,132,001
කාර්යයන්හි ප්‍රගතිය අපවය වීම වෙනුවෙන් ප්‍රතිපාදන			3,626,440
7. ශුද්ධ මූල්‍ය ආදායම			
7.1 මූල්‍ය ආදායම			
පොළී ආදායම-ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත්		37,604,105	38,214,541
පොළී ආදායම-කාර්ය මණ්ඩල ණය		1,247,887	999,378
		38,851,992	39,213,920
7.2 මූල්‍ය වියදම්			
පොළී වියදම්-බැංකු අයිරා			(42,574)
		38,851,992	39,171,346
8. ආදායම් බදු වියදම්			
සාමාන්‍ය කටයුතු මත බදු	8.1	49,402,981	41,223,690
ප්‍රාරම්භ/විලම්භිත බදු වත්කම් ප්‍රතිවර්තනය	16	(767,037)	14,695,235
උද්දේශිත ලාභාංශ බද්ද		10,054,276	
		58,690,220	55,918,925

මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ

	සටහන	**2014** රු.	**2013** රු.
8.1 බද්දට යටත් ලාභය හා ගිණුම් ලාභය සැසඳීම			
බද්දට පෙර ගිණුම් ලාභය		309,167,893	274,710,969
අඩුකලා.ආශ්‍රිත සමාගම්වල ලාභයේ කොටස (බදු ඇතුළුව)		(15,449,315)	(21,387,767)
		293,718,578	253,323,202
ඉඩදිය නොහැකි විෂයාංග මුළු එකතුව		8,368,197	10,475,586
ඉඩදිය හැකි විෂයාංග මුළු එකතුව		(119,151,988)	(12,998,153)
බද්දට යටත් නැති ආදායම		(45,347,560)	(84,753,481)
වෙළඳාම හෝ ව්‍යාපාරයෙන් ලාභ		137,587,227	166,047,154
එකතුකලා.		38,851,991	36,113,782
මුළු ව්‍යවස්ථාපිත ආදායම		176,439,218	202,160,936
අඩුකලා.උපයෝගී බදු පාඩු			(54,933,473)
තක්සේරු කල හැකි/බද්දට යටත් ආදායම		176,439,218	147,227,463
28%ක ව්‍යවස්ථාපිත බදු අනුප්‍රමාණය අනුව අයකල බද්ද		49,402,981	41,223,690
වර්ෂයේ සාමාන්‍ය ක්‍රියාකාරකම් වෙනුවෙන් ප්‍රවර්තන බද්ද	**8**	**49,402,981**	**41,223,690**
		========	=========

9. **කොටසක් වෙනුවෙන් මූලික හා තනුක ඉපැයීම්**

කොටසක් වෙනුවෙන් වූ මූලික ඉපැයීම් ආගණනය කෙරෙනුයේ වාර්තාකිරීමේ කාල පරිච්ඡේදය තුල නිකුත් කොට ඇති සාමාන්‍ය කොටස්වල බරතැබූ මධ්‍ය සංඛ්‍යාවෙන් සාමාන්‍ය කොටස් හිමියන්ට ආරෝපනය කළ හැකි වන්නා වූ ශුද්ධ ලාභය බෙදීමෙනි.

	2014	2013
ලවය වශයෙන් භාවිතාකරන ලද මුදල		
කොටස්හිමි ආරෝපිත ශුද්ධ ලාභය (රු.)	250,489,841	215,899,765
හරය වශයෙන් භාවිතා කරන ලද සාමාන්‍ය කොටස් ගණන	5,000,000	5,000,000
කොටස් වෙනුවෙන් මූලික ඉපයීම් (රු.)	**50.10**	**43.18**
	========	========

2014 මාර්තු 31 දිනට මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

10. දේපළ පිරියත හා උපකරණ

පිරිවැය/තක්සේරුව	ඉඩම් හා නිවාස ව්‍යාපෘති	ගොඩනැගිලි රු.	යාත්‍රා රු.	මෝටර් වාහන රු.	ගෘහ භාණ්ඩ සහ සවිකුරු රු.	කාර්යාලීය උපකරණ හා පරිගණක රු.	ස්ප්‍රෙඩර් රු.	එකතුව රු.
2013 අප්‍රේල් 1 දිනට ශේෂය	5,286,340	43,390	260,000,000	30,546,932	30,918,390	14,648,476	1,828,962	343,272,490
වර්ෂය තුල එකතු කිරීම්	-	-	- -		628,501	1,341,500	-	1,970,001
වර්ෂය තුල බැහැර කිරීම්	-	-	(260,000,000)	(2,250,000)	(229,303)	-	(1,828,962)	(264,308,265)
වර්ෂය තුල මාරු කිරීම්	-	- - -			(17,735,556)	(342,300)	-	(18,077,856)
2014 මාර්තු 31 දිනට ශේෂය	5,286,340	43,390	-	28,296,932	13,582,032	15,647,676	-	62,856,370
සමුච්චිත ක්ෂය වීම්								
2013 අප්‍රේල් 1 දිනට ශේෂය	1,194,844	43,390	225,193,588	18,866,443	11,858,941	11,427,607	1,828,962	270,413,775
වසර සඳහා අයකිරීම්	8,316	-	-	3,063,888	1,082,431	1,117,038 -		5,271,673
බැහැර කිරීම් සඳහා	-	-	(225,193,588)	(2,250,000)	(229,303) -		(1,828,962)	(229,501,853)
මාරු කිරීම් සඳහා	-	-	-	-	(3,453,311)	(129,962) -		(3,583,273)
2014 මාර්තු 31 දිනට ශේෂය	1,203,160	43,390	-	19,680,331	9,258,758	12,414,683 -		42,600,322

ශුද්ධ පොත් අගය	සටහන	2014 රු.	2013 රු.
ඉඩම් හා නිවාස ව්‍යාපෘතිය		4,083,180	4,091,496
යාත්‍රා -			34,806,412
මෝටර් වාහන		8,616,601	11,680,489
ගෘහ භාණ්ඩ හා සවිකුරු		4,323,274	19,059,449
කාර්යාලීය උපකරණ හා පරිගණක		3,232,993	3,220,869
		20,256,048	72,858,715
කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ-ගොඩනැගිලි	**10.1**	3,626,440	3,626,440
අපවය සඳහා ප්‍රතිපාදන		(3,626,440)	(3,626,440)
	10.2	**20,256,048**	**72,858,715**
		========	========

දේපළ පිරියත හා උපකරණ 1994 ජුලි මස රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් නැවතත් තක්සේරු කරන ලදි. දේපළ පිරියත හා උපකරණ අදාල සීරුමාරු කිරීම් සහිතව ඒවායේ භාවිත තත්ත්වයන් අනුව විවෘත වෙළඳපොලේ වටිනාකම් පදනම් කරගෙන තක්සේරු කරන ලදි.

10.3

පිරිවැය		5,120,000	406,819,749
සමුච්චිත ක්ෂය වීම්		(1,120,000)	(368,013,337)
ඉදිරියට ගෙන යන වටිනාකම	10.2	4,000,000	38,806,412

වර්ෂය තුලදී සමාගම විසින් කොළඹ හා ටියුටිකොරින් අතර යාත්‍රා සේවාවන් සඳහා රු. 18,077,856 ක් ගෙවා මිලදී ගත් වත්කම් මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශයට හා පුනරුත්තාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයට පවරන ලදි. රු. 12,759,751 වටිනා (2013-රු. 27,009,274) දේපොල, පිරියත හා උපකරණ සම්පූර්ණයෙන්ම ක්ෂය කිරීමෙන් අනතුරුව සමාගමේ පාවිච්චිය සඳහා තවදුරටත් තබා ගන්නා ලදි.

11. ස්පර්ශනීය නොවන වත්කම්

පරිගණක මෘදුකාංග

පිරිවැය		
වර්ෂාරම්භ ශේෂය	6,144,497	6,144,497
වර්ෂාවසාන ශේෂය	6,144,497	6,144,497
සමුච්චිත ක්ෂය වීම්		
වර්ෂාරම්භ ශේෂය	6,144,497	6,144,497
වර්ෂාවසාන ශේෂය	6,144,497	6,144,497
මාර්තු 31 දිනට කපාහැරි වටිනාකම -		-
	=======	=======

12. උපකාරක සමාගම්වල ආයෝජන

	කොටස් සංඛ්‍යාව	ධාරිතාවේ ප්‍රතිශතය		
සී/ස සිලෝන් ෂිපින් ඒජන්සි (ප්‍රයිවට්) ලිමිටඩ්	9,999	100%	99,990	99,990
අපවය සඳහා ප්‍රතිපාදන			(99,990)	(99,990)
			-	-

උපකාරක සමාගම් වසාදැමීම සඳහා 2006 මාර්තු 20 වැනි දින පැවති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී ගන්නා ලද තීරණයේ ප්‍රතිඵලයක් වශයෙන් උපකාරක සමාගමේ මූල්‍ය ප්‍රකාශ සමාගම විසින් ඒකාබද්ධ නොකොට තිබේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයෙන් ඉක්බිතිව 2006 මැයි සිට උපකාරක සමාගම තම මෙහෙයුම් නවතා තිබේ. දැනට උපකාරක සමාගම් ඈවර කෙරෙමින් පවතී

	2014	**2013**
	රු.	**රු.**
13. ආශ්‍රිත සමාගම් වල ආයෝජන		
ස්කන්ධ ක්‍රමය අනුව ඉදිරියට ගෙනයන වටිනාකම		
සිලෝන් ෂිපිං ලයින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	189,549,790	178,300,582
සිලෝන් ෂිපිං ඒජන්සි (ප්‍රයිවට්) ලිමිටඩ්- සිංගප්පූරුව	50,223,294	46,875,806
	239,773,084	225,176,388
	==========	=========

13.1 ආශ්‍රිත සමාගම් වල ආයෝජන

පිරිවැය

	කොටස් සංඛ්‍යාව	ධාරිත්ව ප්‍රතිශතය		
සිලෝන් ෂිපිං ලයින්ස් (ප්‍රයිවට්)ලිමිටඩ්	156,942	39%	1,569,420	1,569,420
සිලෝන් ෂිපිං ඒජන්සි (ප්‍රයිවට්)ලිමිටඩ්- සිංගප්පූරුව	24,500	49%	143,622	143,622
			1,713,042	1,713,042

13.2 ස්කන්ධ ක්‍රමය අනුව ආශ්‍රිත සමාගම්හි ආයෝජන සංචලනය

ශුද්ධ වත්කම්වල ආයෝජකයාගේ කොටස

වර්ෂාරම්භ ශේෂය	225,176,388	196,912,331
ආශ්‍රිත සමාගම්වල ලාභයේ කොටස (බදු ඇතුළුව)	15,449,315	21,387,767
ආශ්‍රිත සමාගම්වල වෙනත් සවිස්තරාත්මක ආදායමේ කොටස (බදු ඇතුළුව)	6,080	9,762
ලාභාංශ ආදායම	(858,698)	(329,580)
ඉහත වර්ෂයේ දෝෂ නිවැරදි කිරීම	-	7,196,107
වර්ෂාවසාන ශේෂය	239,773,084	225,176,388

13.3 ආශ්‍රිත සමාගම්වල සංක්ෂිප්ත මූල්‍ය තොරතුරු

	සිලෝන් ෂිපිං ඒජන්සි(ප්‍රයිවට්)ලිමිටඩ් සිංගප්පූරුව		සිලෝන් ෂිපිං ලයින්ස්(ප්‍රයිවට්) ලිමිටඩ්	
දෙසැම්බර් 31 වන විට	**2013**	**2012**	**2013**	**2012**
මුළු වත්කම්	208,297,106	204,433,934	610,031,803	585,027,862
මුළු වගකීම්	98,335,860	101,309,507	71,326,719	75,166,903
ශුද්ධ වත්කම්	109,955,246	103,124,427	538,705,084	509,860,960
ආදායම	733,838,376	899,754,150	397,381,307	371,189,029
මෙහෙයුම් වියදම්	725,291,820	887,746,815	396,266,320	377,739,625
වෙනත් ආදායම්	587,283	70,295	14,170,311	29,941,039
වර්ෂය සඳහා ලාභ	8,607,223	11,272,918	28,799,425	40,678,399
වර්ෂය සඳහා මුළු සවිස්තරාත්මක ආදායම	7,863,378	25,958,849	29,749,589	40,703,429

14. මූල්‍ය සාධන පත්‍ර

මූල්‍ය වත්කම් ගණයන් සහ මූල්‍ය වගකීම්

මූල්‍ය වත්කම්වල සහ මූල්‍ය වගකීම්වල ඉදිරියට ගෙනයන වටිනාකම (මූල්‍ය තත්ත්ව ප්‍රකාශයන් තුල සඳහන් පරිදි) පහත පරිදි වේ.

මූල්‍ය වත්කම් සහ වගකීම්වල ඉදිරියට ගෙනයන වටිනාකම

	සටහන්		
14.1 මූල්‍ය වත්කම්			
14.1.1 විකිණීමට ඇති			
ලැයිස්තුගත ආයෝජන	15.1	28,620,720	35,450,738
ලැයිස්තුගත නොවූ ආයෝජන	15.2	2,377,070	2,377,070
		30,997,790	37,827,808

ලැයිස්තුගත ආයෝජන ගණනය කරනු ලබන්නේ සක්‍රිය වෙළඳපලේ ලැයිස්තුගත මිල පදනම් කරගත් සාධාරණ මිල අනුවය. ලැයිස්තුගත නොවූ ආයෝජනවල සාධාරණ මිල ස්ථිරසාර ලෙස පිරිවැය අනුව ගණනය කළ නොහැකි බැවින් අපචය වීම් සඳහා වූ ප්‍රතිපාදන අඩුකොට ආගණනය කෙරේ.

	සටහන	2014 රු	2013 රු
14.1 මූල්‍ය වත්කම්			
14.1.2 කල්පිරීම් සඳහා තබා ඇති ආයෝජන			
භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජන	19	291,653,566	131,700,530

ලැබිය යුතු පොලියද ඇතුළුව, කල්පිරීම සඳහා තබා ඇති ආයෝජන ගණනය කෙරේ.

	සටහන	2014 රු	2013 රු
14.1.3 ණය හා ලැබීම් නියමිත			
වෙළඳ හා අනෙකුත් ලැබීම් නියමිත	17	1,215,690,954	1,153,675,616
කෙටිකාලීන ආයෝජන	20	224,010,853	204,820,643
මුදල් හා මුදල් සාමානයන්	21	67,550,337	73,186,619
		1,507,252,144	1,431,682,878

ණය සහ ලැබීම් නියමිතවල ඉදිරියට ගෙනයන වටිනාකම අනුව සඳහන්කොට ඇත්තේ ඒවායේ අගය සාධාරණ වටිනාකමට ආසන්නවන බැවිනි.

	සටහන	2014 රු	2013 රු
මුළු මූල්‍ය වත්කම්		1,829,903,500	1,601,211,216
14.2 මූල්‍ය වගකීම්			
වෙළඳ අනෙකුත් ගෙවීමට නියමිත	28	793,180,578	874,692,411
බැංකු අයිරා	21	4,131,842	-
මුළු මූල්‍ය වගකීම්		797,312,420	874,692,411

මූල්‍ය වගකීම්වල ඉදිරියට ගෙනයන වටිනාකම අනුව සඳහන් කරන ලද්දේ ඒවායේ ඉදිරියට ගෙනයන වටිනාකම සාධාරණ අගයට ආසන්න වන බැවිනි.

15. විකිණීමට ඇති මූල්‍ය වත්කම්

	සටහන	2014 රු	2013 රු
ලැයිස්තුගත ආයෝජන	15.1	28,620,720	35,450,738
ලැයිස්තුගත නොවූ ආයෝජන	15.2	2,377,070	2,377,070
		30,997,790	37,827,808
15.1 ලැයිස්තුගත ආයෝජන			
වර්ෂාරම්භ ශේෂය		35,450,738	41,818,848
සාධාරණ වටිනාකමේ වෙනස්කම් මත පාඩු		(6,830,018)	(6,368,110)
වර්ෂාවසාන ශේෂය		28,620,720	35,450,738

		2014		2013	
	කොටස් සංඛ්‍යාව	පිරිවැය රු.	වෙළඳපල වටිනාකම	පිරිවැය රු	වෙළඳපල වටිනාකම
මර්කන්ටයිල් ෂිපිං කම්පනි පීඑල්සී	238,506	2,068,800	28,620,720	2,068,800	35,450,738
		========	========	=======	========

15.2 ලැයිස්තුගත නොවූ ආයෝජන

ලැයිස්තුගත නොවූ ආයෝජන වල සාධාරණ අගය ගණනය කළ නොහැකි බැවින් අපවය නොවූ පාඩු අඩුකොට පිරිවැය අනුව සඳහන් කරන ලදි.

	සටහන කොටස් සංඛ්‍යාව	2014 රු.	2013 රු.
සී/ස ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම	31206	312,060	312,060
සිලෝන් පෝර්ට් සර්විස් ලිමිටඩ්	5000	50,000	50,000
සී/ස ශ්‍රී ලංකා පෝර්ට් මැනේජ්මන්ට් ඇන්ඩ් කන්සල්ටන්සි ලිමිටඩ්	1501	15,010	15,010
සී/ස ලංකා කෝල් කම්පනි(ප්‍රයිවට්)ලිමිටඩ්	200000	2,000,000	2,000,000
	15	2,377,070	2,377,070
		========	=========

16. විලම්බිත බදු වත්කම්

		2014	2013
වර්ෂාරම්භ ශේෂය		3,180,367	17,875,603
	8	767,037	(14,695,235)
වර්ෂාවසාන ශේෂය	16.1	**3,947,404**	**3,180,367**
		========	===========

වත්කම්වල හා වගකීම්වල ඉදිරියට ගෙනයන වටිනාකම සහ වත්කම්වල හා වගකීම්වල බදු පදනමේ ඉදිරියට ගෙනයන වටිනාකම අතර තාවකාලික වෙනස්කම් මත විලම්භිත බද්ද හඳුනාගනු ලබන අතර 28% සඵල පොලී අනුපාතය අනුව ගණනය කරනු ලැබේ.

16.1බදු වත්කම් හා වගකීම්වල විලම්භිත බදු විශ්ලේෂණය

		2014	2013
විලම්භිත බදු වගකීම්			
ප්‍රත්‍යාගණන ලැබීම්		-	(7,309,686)
ත්වරිත ක්ෂයවීම් වලින්		(1,748,236)	(4,630,234)
		(1,748,236)	(11,939,920)
විලම්භිත බදු වත්කම්			
විශ්‍රාම ප්‍රතිලාභ බැදියාවන්ගෙන්		5,695,640	5,128,331
ගිණුම් ප්‍රතිපාදන වලින්		-	9,991,957
		5,695,640	15,120,288
	16	3,947,404	3,180,368
		========	=========

විලම්බිත බදු වත්කම් විශ්‍රාම ප්‍රතිලාභ බැඳියාවන් උදෙසා ප්‍රතිපාදන වශයෙන් ද, සෙසු ලැබීම් අපවය ප්‍රතිපාදන සඳහාද හඳුනාගැනෙන අතර ඉදිරියට ගෙනයන බදු අහිමිවීම් අනාගත බද්දට යටත් ලාභ සම්භාවී වන තරමට උපලබ්ධි කෙරෙන අතර විලම්බිත බදු බැඳියාවන් ක්ෂය කිරීම් හා ප්‍රත්‍යාගණන අතිරික්ත ත්වරණය කිරීම් සඳහා හඳුනාගැනේ.

මාර්තු 31 වන දිනට	සටහන	2014 රු.	2013 රු.
17. වෙළඳ හා වෙනත් ලැබීම් නියමිත			
වෙළඳ ලැබීම් නියමිත	17.1	1,100,355,337	1,106,719,797
තැන්පතු හා අත්තිකාරම්	17.2	6,526,933	8,925,717
කාර්ය මණ්ඩල ලැබීම් නියමිත	17.3	42,530,761	31,922,673
වෙනත් ලැබීම් නියමිත	17.4	66,277,923	6,107,429
		1,215,690,954	1,153,675,616

17.1 වෙළඳ ලැබීම් නියමිත

		2014	2013
වෙළඳ ලැබීම් නියමිත		1,276,614,498	1,254,241,780
අපවය සඳහා ප්‍රතිපාදන		(176,259,161)	(147,521,983)
	17	1,100,355,337	1,106,719,797

වෙළඳ ලැබීම් නියමිත තුල සම්බන්ධිත පාර්ශව වලින් ලැබෙන පහත දැක්වෙන ලැබීම් නියමිත අඩංගුය.

සම්බන්ධිත පාර්ශව වලින් ලැබීම් නියමිත

	2014	2013
රාජ්‍ය ආයතන	1,005,425,367	916,861,158

වෙළඳ ලැබීම් නියමිතවල කාලසීමා පහත දැක්වේ.

වෙළඳ ලැබීම් නියමිත කාල

	2014	2013
අවුරුද්දක් දක්වා	766,906,430	945,431,108
අවුරුදු 1-4 දක්වා	342,257,495	94,285,924
අවුරුදු 4ට වැඩි	167,450,573	214,524,748
	1,276,614,498	1,254,241,780

වෙළඳ ලැබීම් නියමිත අපවයවීම් සමාලෝචනය කරන ලදි.ඇතැම් වෙළඳ ලැබීම් නියමිත අපවය වී ඇතිබව පෙනීයන ලදි. එවැනි අපවය වීම් සඳහා සටහන 3.9.1 පරිදි ප්‍රතිපාදන සලසන ලදි.

වෙළඳ ලැබීම් වෙනුවෙන් සලසන ලද ප්‍රතිපාදන පිළිබඳ විස්තර

	2014	2013
රජයේ ආයතන	36,206,870	36,206,870
විදේශීය නියෝජිතයන්	64,024,592	38,456,318
පෞද්ගලික ආයතන	44,083,601	43,405,411
වෙනත්	31,944,098	29,453,384
	176,259,161	147,521,983

17.2 තැන්පතු සහ අත්තිකාරම්

		2014	2013
බහාළුම් තැන්පතු		4,152,806	4,311,796
වෙනත් ආපසු ගෙවිය යුතු තැන්පතු		7,914,465	7,914,465
අත්තිකාරම්		2,788,572	5,028,366
අපවය වීම් සඳහා ප්‍රතිපාදන		(8,328,910)	(8,328,910)
	17	6,526,933	8,925,717

17.4 කාර්ය මණ්ඩල ලැබීම් නියමිත

කාර්ය මණ්ඩල ණය		38,927,099	29,741,877
අත්තිකාරම් සහ වෙනත්		3,603,662	2,180,796
	17	42,530,761	31,922,673
		===========	=========

මාර්තු 31 දිනට	සටහන	2014 රු.	2013 රු.
17.4 අනෙකුත් ලැබීම් නියමිත			
සහතික කල අළුත්වැඩියා ලැබීම් නියමිත		19,839,635	19,839,635
භාණ්ඩාගාරයේ ඇති රාජ්‍ය ආයතන වල තාවකාලික අතිරික්ත මුදල්		59,558,465	-
වෙනත්		10,207,028	9,595,000
අපවය සඳහා ප්‍රතිපාදන		(23,327,205)	(23,327,205)
	17	66,277,923	6,107,429
18. ව්‍යවස්ථාපිත ලැබීම් නියමිත			
ආර්ථික සේවා ගාස්තු		1,915,323	1,915,323
රඳවා ගැනීමේ බද්ද		14,675,878	14,675,878
භාණ්ඩ හා සේවා බදු		18,936,777	18,936,777
ජාතික ආරක්ෂක බද්ද		2,612,349	2,612,349
		38,140,327	**38,140,327**
		===========	=========
19. කල්පිරීම් ආයෝජන			
භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන		291,653,566	131,700,530
		===========	=========
20. කෙටිකාලීන ආයෝජන			
ස්ථිර තැන්පතු වල ආයෝජන	20.1	193,978,479	175,478,157
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව - කාර්ය මණ්ඩල ණය		30,032,374	29,342,486
		224,010,853	**204,820,643**
		===========	=========
20.1 ස්ථාවර තැන්පතුවල ආයෝජන			
මහජන බැංකුව		192,198,902	173,730,814
ලංකා බැංකුව		1,386,167	1,403,167
ලංකා වාණිජ බැංකුව		35,000	35,000
ලංකා වාණිජ බැංකුව(PLC) ආරක්ෂණ හා නිවාස ණය		358,410	319,176
		193,978,479	**175,478,157**
		===========	==========
21. මුදල් හා මුදල් සාමානයන්			
අත ඇති මුදල්		233,707	233,387
කෙටිකාලීන තැන්පතු		-	7,295,444
බැංකුවේ ඇති මුදල්		67,316,630	65,657,788
		67,550,337	73,186,619
බැංකු අයිරා		(4,131,842)	-
මුදල් ප්‍රවාහ ප්‍රකාශ සඳහා ශේෂය		**63,418,495**	**73,186,619**
		===========	==========

මාර්තු 31 දිනට

	සටහන	2014 රු.	2013 රු.
22 විකිණීමට ඇති සේ වර්ගකරන ලද වත්කම්			
ලංකා මුද්‍රිත නාවික යාත්‍රාව -			12,326,800
		=======	========

අදාල වර්ෂය තුලදී අමාත්‍යමණ්ඩල තීරණයක් අනුව විකිණීමට රඳවාගෙන තිබෙන නාවික යාත්‍රාවක් සේ වර්ගීකරණය කරන ලද ලංකා මුද්‍රිත නෞකාව අධ්‍යක්ෂක මණ්ඩලයේ යෝජනා සම්මතයක් අනුව සී/ස සිල්වර් ලයින් එක්ස්පෝටර්ස් (ප්‍රයිවට්) සමාගමට රු. 43,616,100/= ට විකුණන ලදි.

23 ප්‍රකාශිත ප්‍රාග්ධනය

		2014 රු.	2013 රු.
නිකුත් කල හා සම්පූර්ණයෙන් ගෙවූ			
එකක් රු. 10 බැගින් වූ සාමාන්‍ය කොටස්		50,000,000	50,000,000
		=========	========

24 කොටස් ප්‍රාග්ධනය සඳහා දායකත්වය

ප්‍රාග්ධන දායකත්වය, කාරක ප්‍රාග්ධනය, අත්තිකාරම් හා නව මගී පර්යන්තය සඳහා ආයෝජන වෙනුවෙන් භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදල් මෙයින් නියෝජනය වේ.

25 ප්‍රාග්ධන සංචිතය

මෙයින් දැක්වෙන්නේ ASTARSA ණය සහ මහජන බැංකුවෙන් ලබාගන්නා ලද භාණ්ඩාගාර ඇප සහතික ණය වෙනුවෙන් මහභාණ්ඩාගාරය විසින් කළ නිරවුල් කිරීමය.

26 ප්‍රත්‍යාගණන සංචිතය

1994 දී සිදුකරන ලද තක්සේරුව ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කරන ලද ඒ ඒ වත්කම් හඳුනා නොගත් කල ප්‍රත්‍යාගණනය කළ අතිරික්තයේ කොටස රඳවාගත් ඉපැයීම්වලට මාරුකිරීම අනුව දේපොල පිරියත හා උපකරණ වල ප්‍රත්‍යාගණන අතිරික්තය ප්‍රත්‍යාගබක සංචිතයට සම්බන්ධතාවයක් දක්වයි.

	සටහන	2014 රු.	2013 රු.
27 විශ්‍රාම ප්‍රතිලාභ බැදියාවන්			
වර්ෂාරම්භ ශේෂය		18,315,468	21,941,868
වර්ෂයප සඳහා ප්‍රතිපාදන	27.1	2,107,329	805,230
		20,422,797	22,747,098
වර්ෂය තුල කරන ලද ගෙවීම්		(81,226)	(4,431,630)
වර්ෂාවසාන ශේෂය		**20,341,572**	**18,315,468**
		========	========
27.1 වර්ෂය සඳහා ප්‍රතිපාදන			
ප්‍රවර්තන සේවා පිරිවැය		827,330	633,479
වසර සඳහා පොලී අයකිරීම		1,967,081	2,356,557
ජීවගණක උපකල්පන වෙනස්වීම මත උද්ගත වූ ලැබීම්		(687,082)	(2,184,806)
	27	2,107,329	805,230

මාර්තු 31 දිනට

	2014	2013
	රු.	රු.

27 විශ්‍රාම ප්‍රතිලාභ බැදියාවන්-පාරිතෝෂික

සමාගම විසින් උපකල්පන සිදුකරනු ලබන්නේ විශ්‍රාම ප්‍රතිලාභ බැදියාවන් ගණනය කිරීම සඳහා කළමනාකාරිත්වයේ විචලායන්ගේ ප්‍රශස්ත ඇස්තමේන්තු පදනම් කර ගනිමිනි. වට්ටම් අනුපාත තීරණය කරනු ලබන්නේ දිගුකාලීන වෙළදපොල අනුපාතිකයන් පදනම් කරගනිමිනි.

භාවිතාකරන ලද මූලික උපකල්පන පහත පරිදි වේ.

	2014	2013
වට්ටම් සාධකය	10.75%	11%
ඉදිරි වැටුප් වැඩිවීම්	1.29%	1.25%
කාර්ය මණ්ඩල පිරිවැටුම් සාධකය	0.78%	6.7%
විශ්‍රාම වයස	අවුරුදු 60	අවුරුදු 60

28 වෙළඳ හා වෙනත් ගෙවීම් නියමිත

	2014	2013
වෙළඳ ගෙවීම් නියමිත	794,510,230	866,269,208
තැන්පතු	99,362	99,362
වෙනත්	(1,429,014)	8,323,841
	793,180,578	**874,692,411**

29 ව්‍යවස්ථාපිත ගෙවීම්

	2014	2013
වත්මන් බදු	63,917,966	49,212,617
මුද්දර ගාස්තු	17,669	17,269
එකතු කල අගය මත බදු	35,307,065	19,924,742
	99,242,700	**69,154,628**

30 උපචිත වියදම්

	2014	2013
උපචිත වියදම්	6,139,898	3,282,000

මූල්‍ය ප්‍රකාශ වල සීරුමාරු කිරීම් හෝ හෙළිදරව් කිරීම් සිදුකල යුතු වූ වැදගත් අවිනිශ්චිත බැදියාවන් කිසිවක් නොවීය. මෙකී හිමිකම් පෑම් සාධාරණ නොවන බවත් ඒවා නිරවුල් කිරීම් සඳහා සම්පත් පිටතට ගලායාමක සම්භාවිතාවක් දැන්ම ඇති නොවන ඇතැයි යන්න කළමනාකාරිත්වයේ අදහසයි. සමාගමේ නෛතික අංශයේ උපදේශයන්ට අනුව මෙම අගැයීම් අනුකූල වන අතර පහත දැක්වෙන නඩු සඳහා ප්‍රතිපාදන වෙන්කොට නොමැත.

31. ලංකා මහපොල යාත්‍රාව හිස්නෞකාවක් වශයෙන් කුලියට දීමේ ගිවිසුම M/S Triple “S” Shipping (Pvt)Limited සමාගම විසින් කඩකරන ලද එම නැවේ කෙන්යාවේ “මොම්බාසාහි” නාවික අධිකරණ විනිශ්චය බල ප්‍රදේශ විකිරණය භාරයේ තිබියදී එය 2013 මැයි මස 12 දින නැවත භාරදෙන ලදි. එකී අධිකරණයේ භාරයෙන් නැව මුදා ගැනීම සහ නැවේ කාර්ය මණ්ඩලයේ සියළු වැටුප් සහ ඒවාට අදාල වියදම් ගෙවීමට සමාගමට සිදුවිය. ඉන්පසුව, නැව කුලියට හෝ සභාගමෙන් මූලික වශයෙන් පැහැර හැරී නම් කුලී අයකර ගැනීම සඳහා තීරක තීන්දුවක් වෙත යොමුකරන ලදි. දැනට නැව් කුලියට හෝ සමාගමෙන් නීත්‍යානුකූල හිමිකම් ලබාගැනීම සඳහා තීරක තීන්දුවක් පිළිබඳ කටයුතු ක්‍රියාත්මක කෙරෙමින් පවතී.

Lanka Coal සමාගමට ගල් අඟුරු සැපයීම පිණිස ඉන්දියාවේ මුම්බායිහි Taurin Iron & Steel Company සමාගම සමඟ ගිවිසුමකට එලඹෙන ලදි. පුත්තලමේ පිහිටි “ ලක්විජය” බලාගාරය සඳහා ගල් අඟුරු මිලදී ගැනීමේ සිදුකෙරෙන්නේ ලංකා විදුලිබල මණ්ඩලය විසින් වන අතර, එම ගල් අඟුරු ගුණාත්මක නොවන බවට ලංකා විදුලිබල මණ්ඩලය විසින් කරන ලද පැමිණිල්ලකට අනුව ගල් අඟුරු සැපයීම නවතා දමන ලදි. මෙම කරුණ තීරක තීන්දුවකට යොමුකරනු ලද අතර එහි කටයුතු ආරම්භ කිරීමට නියමිතය.

සමාගම සහ නැව් හිමියා අතර ඇතිවූ ආරාවුලක් හේතුකොටගෙන ලංකා ඛණිජතෙල් සංස්ථාවට බොරතෙල් සැපයීම නතර විය. ගිවිසුමට අදාල බැඳියාවන් වගඋත්තරකාර නැව් හිමියා විසින් ඉටුකරනු ලැබීමට අපොහොසත් වීම සහ ප්‍රමාද ගාස්තු ගණනය කිරීම පිළිබඳව පාර්ශව දෙක තුල එකඟතාවක් නොමැතිවීම නිසා මෙම කරුණ අර්බුදයට ලක්ව තිබේ. තහනම් නියෝගයකට යටත්ව ඇති නවතම බොරතෙල් තොගය නිදහස්කර ගැනීමට පෙරාතුව සමාගම විසින් කොන්දේසි විරහිත බැංකු ඇපකරයක් බැංකුව විසින් ඉදිරිපත්කොට තිබේ. නැව් හිමියාට දී ඇති එම ඇපකරයේ වටිනාකම එ.ජ. ඩොලර් 346,80,33 වක් වන අතර ප්‍රමාදගාස්තු පිළිබඳ ආරාවුල සමථයකට පත්කරනු පිණිස ත්‍රෛපාර්ශවීය ගිවිසුමක් අත්සන් කලද අදාල පාර්ශවයන්ට සුහදශීලීව එය බේරුම් කර ගැනීමට නොහැකිව ඇත. එබැවින් සුහදශීලීව මෙම ගැටළුව විසඳා ගැනීමට දැනටමත් සාකච්ඡාවක් ආරම්භ කොට ඇත.

32. සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම්

සමාගමට සම්බන්ධිත පාර්ශවයන් නම් ශ්‍රී ලංකා රජය, රජය සතු සමාගම්, වෙනත් සම්බන්ධිත ආයතන හා කළමනාකරණ නිලධාරීන් පිරිස්ය.

32.1 ප්‍රධාන කළමනාකරණ නිලධාරී පිරිස් සමඟ ගණුදෙනු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 24 ප්‍රකාරව "සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම්" (ප්‍රධාන කළමනාකරණ පිරිස්) යනු සෘජුව හෝ වක්‍රව ආයතනයේ ක්‍රමසම්පාදනය, මෙහෙයවීම හා පාලනය කිරීමට වගකීම් පැවරී ඇති කණ්ඩායම්ය. ඒ
අනුව, අධ්‍යක්ෂක මණ්ඩලය මත කළමනාකරු සහ මෙහෙයුම් කළමනාකරුවන් ප්‍රධාන කළමනාකරණ පිරිස් ලෙස වර්ගකරනු ලැබ තිබේ.
ප්‍රධාන කළමනාකරණ කණ්ඩායම් සමඟ ගණුදෙනු

	2014	2013
පඩිනඩි හා අනෙකුත් කෙටිකාලීන සේවක ප්‍රතිලාභ	12,413,746	11,788,716
ගෙවීමට ඉතිරිව තිබෙන ණය හා අත්තිකාරම්	2,649,021	3,893,863
පශ්චාත් රැකියා නියුක්ති ප්‍රතිලාභ	7,570,449	5,577,918

32.2 සම්බන්ධිත පාර්ශව ගණුදෙනු

සමාගම විසින් නිරත වූ සම්බන්ධිත පාර්ශව ගණුදෙනුවලින් කැපී පෙනෙන ඒවා පහත දැක්වේ. ශ්‍රී ලංකා රජය සමඟ සතු ව්‍යවසායයන් හා රජයට සම්බන්ධ සෙසු ආයතන සමඟ ගණුදෙනු, ශ්‍රී ලංකා රජය, සමාගමේ එකම ප්‍රාග්ධනධාරියා වන අතර, සමාගමේ මෙහෙයුම් කටයුතු පාලනය කිරීමේ අයිතිය රජය සතුවේ. ඒ අනුව, ශ්‍රී ලංකා රජය සහ ශ්‍රී ලංකා රජය විසින් ඒකාබද්ධව පාලනය කරනු ලබන හා කැපී පෙනෙන බලපෑම් කරනු ලබන අනෙකුත් ආයතන (රජයට සම්බන්ධ ආයතන) සමාගම මගින් සලකනු සම්බන්ධිත පාර්ශව ලෙසිනි.

සම්බන්ධිත පාර්ශව	ගණුදෙනුවේ ස්වභාවය	ගණුදෙනුවේ වටිනාකම	ලැබිය යුතු/දිනය ශේෂ වටිනාකම (31/03/2014 වනවිට)
ශ්‍රී ලංකා රජය	නැව් බඩු ප්‍රවාහන ගාස්තු, කුලී ගාස්තු, බහාළුම් කුලියට දීම, නිශ්කාෂණය හා නැව්බඩු යැවීම සහ සෙසු අය පැනවීම්,ප්‍රදාන නැවත ගෙවීම් කාර්යාල කුලී ලැබීම්	රු. 232,906,920	
රජය සතු ව්‍යවසාය	නිරවුල් කිරීම්	රු. 184,488,899	රු. 111,126,772
	නැව්බඩු ප්‍රවාහන ගාස්තු, නිශ්කාෂණය හා නැව්බඩු යැවීම හා සෙසු අය පැනවීම	රු. 43,193,342	රු. 64,54,737
	නිරවුල් කිරීම්	රු. (39,423,792)	රු. 64,54,737
	නැව්බඩු ප්‍රවාහන ගාස්තු,	රු. 3,612,319,908	

	ගොඩනැගිලි හා පැටවීමේ ගාස්තු, එසවීමේ ගාස්තු නිරවුල් කිරීම්	රු. (3,576,399,011)	රු. 886,563,340
රජය සම්බන්ධිත සෙසු ආයතන	නැව් බඩු නිශ්කාෂණය හා නැව්බඩු යැවීමේ හා අනෙකුත් ගාස්තු	රු. 4,662,437	
	නිරවුල් කිරීම්	රු. (4,206,696)	රු. 1,280,518

33. සුරැකුම් වශයෙන් ප්‍රතිඥාත වත්කම්

සුරැකුම් වශයෙන් සමාගම විසින් ප්‍රතිපාදන ඇපකර පහත දැක්වේ.

පහසුකමේ වර්ගය	පහසුකමේ සීමාව	භාවිතයට ගත්/ඉතිරි	ඇපකර
බැංකු අයිරාව-මහජන බැංකුව	රු. මිලියන 100	නැත	රු. මිලියන 173ක ස්ථිර තැන්පතු

34. වාර්තා කිරීමේ දිනයට පසුව උද්ගත වූ සිදුවීම්

පහත දැක්වෙන දෑ හැරුණු කොට මූල්‍ය ප්‍රකාශවල සීරුමාරු කිරීම් හෝ හෙළිදරව් කිරීම් සිදුකිරීම අවශ්‍ය කෙරෙන වැදගත් සිදුවීම් කිසිවක් නැත.

35. සමාගම විසින් DWT 63600 ධාරිතාවකින් යුක්ත Panama Bulker දෙකක් එ.ජ. ඩොලර් මිලියන 70 කට මිලදී ගැනීම සඳහා චීනයේ AVIC International ආයතනය සමඟ 2014.02.18 දින ගිවිසුමක් ඇතිකරගෙන තිබෙන අතර කැඩෙට්වරු පුහුණු කිරීමේ පහසුකම් සහිත ඉහත කී ධාරිතාව සහිත මෙකී නැව් සඳහා 2013.12.23 දින ඉදිරිපත් කරනු ලද ස්වාධීන යෝජනාව අමාත්‍යමණ්ඩලය විසින් අනුමත කරනු ලැබ ඇත.

නැව් සැපයුම්කරු සමඟ සමාගම විසින් "ගැනුම්කරු ණය නියමතා" යටතේ ගිවිසුමකට එළඹ ඇති අතර, ඒ සඳහා අවැසි අරමුදල් සපයා ගැනීම උදෙසා මාස 06 ක 06%ක වාර්ෂික පොළී සහිත LIBRO+5.5% යටතේ එ.ජ.ඩොලර් මිලියන 70 ක ණයක් මහජන බැංකුවෙන් අයදුම්කොට තිබෙන අතර මහජන බැංකුව මේ සඳහා එ.ජ. ඩොලර් මිලියන 10ක (මාස 06ක කාලයක් සඳහා වාර්ෂිකව LIBRO LIBRO+3% ක පොළියක් යටතේ) අතිරේක මුදලක් අනුමත තිබේ. මෙම මුදල අනුමත කරනු ලැබ ඇත්තේ ඉහත කී ණයට අදාළ වන පොළිය ගෙවීම සඳහාය.

36. මූල්‍ය අවදානම් කළමනාකරණය

මූල්‍ය උපකරණ භාවිතය තුලින් සමාගමට පහත දැක්වෙන මූල්‍ය අවදානම්වලට මුහුණදීමට හැකිවන අතර එබඳු මූල්‍ය අවදානම් සමනය කර ගැනීම සඳහා සමාගම විවිධ කළමනාරණ ක්‍රමෝපායන් භාවිතා කරයි.

36.1 ණය අවදානම්
36.2 ද්‍රවශීල අවදානම්
36.3 වෙළඳ පොල අවදානම (මුදල් ඒකක අවදානම හා පොලී අනුපාතික අවදානම)

සමාගමේ මූල්‍ය උපකරණ වලට අයත් වන්නේ ලැයිස්තුගත හෝ ලැයිස්තුගත නොවූ කොටස් ආයෝජන, කාලීන තැන්පතුවල හා භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජන, මුදල් හා මුදල් සාමානයන්ය. සමාගමට එහි ප්‍රධාන ව්‍යාපාරික කටයුතු වලින් වෙළඳ ලැබීම් නියමිත හා ගෙවීම් නියමිත තිබේ. කෙටිකාලීන තැන්පතුවල ප්‍රධාන කාර්යාර්ථය වනුයේ මෙහෙයුම් කටයුතු සඳහා ද්‍රවශීලතාව පවත්වා ගැනීමය. ලැයිස්තුගත හා ලැයිස්තුගත නොවන කොටස්වල ආයෝජනය කිරීම වූ කලී ක්‍රමෝපායීය ආයෝජනයන්ය.

36.1 ණය අවදානම

ණය අවදානම වූ කලී, සම පාර්ශවකරු විසින් ගිවිසුමට අදාල බැඳියාවන් ඉටුකිරීමට අපොහොසත් වන තන්හිදී සමාගමට දැරීමට සිදුවන මූල්‍ය පාඩුය. ණය අවදානම් උද්ගත වන්නේ ප්‍රධාන වශයෙන්ම බැංකුවල ඇති තැන්පතු, මුදල් හා මුදල් සාමානයන් (අත ඇති මුදල් හැර) සහ ණයුදෙනුකරුවන් වෙතින් වූ ලැබීම් නියමිත වලිනි. ණය අවදානමට යටත් මූල්‍ය වත්කම් උපරිම ණය අවදානම්වලට නිරාවරණයවීම ඒවායේ ඉදිරියට ගෙනයන වටිනාකමට සමාන වේ.

2014 මාර්තු 31 දිනට වාර්තා කරන ලද මූල්‍ය උපකරණ උපරිම අවදානම්වලට නිරාවරණය වීම පහත සටහනින් දැක්වේ.

මූල්‍ය වත්කම්, අවදානම්වලට නිරාවරණය වීම.

	සටහන	2014	2013
මුදල් හා මුදල් සාමානයන්	36.1.1	67,316,630	72,953,233
බැංකුවෙත ඇති කාලීන තැන්පතු		224,010,853	204,820,643
වෙළඳ ලැබීම් නියමිත	36.1.2	1,276,614,498	1,254,241,780
වෙනත් ලැබීම් නියමිත		115,335,617	46,955,819
		1,683,277,598	1,578,971,475

36.1.1 මුදල් හා මුදල් සාමානයන්

මාස 3ක් හෝ ඊට වැඩි මූලික කල්පිරීම් සහිතවූ සහ ඉහල ද්‍රවශීලතාවක් ඇති කෙටිකාලීන ආයෝජන මෙන්ම බැංකුවේ ඇතිමුදල් (අත ඇති මුදල් හැර) ඉල්ලූ විටක දිය යුතු තැන්පතු යනාදිය මුදල් හා මුදල් සාමානයන්ට ඇතුලත් වේ. විස්තර පහත දැක්වේ.

	සටහන	2014	2013
කෙටිකාලීන තැන්පතු		-	7,295,444
බැංකු වෙත ඇති මුදල්	36.1	67,316,630	65,657,788
		67,316,630	72,953,233

36.1.2 වෙළඳ ලැබීම් නියමිත

සමාගම ප්‍රධාන වශයෙන්ම නාවික ඒජන්තවරුන් හා රජය සමඟ වෙළඳාම් කරයි. අතීත අත්දැකීම් පදනම් කරගෙන සමාගම නාවික ඒජන්තවරුන්ගේ ණයවල ගුණාත්මක භාවය තක්සේරු කරයි. මීට අමතර වශයෙන් අයවීමට ඇති ශේෂ වර්තන පදනමක් මත කළමනාකරණ කමිටුව හා මණ්ඩලය විසින් අන්වේෂණය කරනු ලබයි.

වෙළඳ ලැබීම් නියමිත වියැයීම්

	සටහන	2014	2013
එක් වසරක් දක්වා		766,906,430	945,431,108
1-4 වසර දක්වා		342,257,495	94,285,924
වසර 4ට වැඩි		167,450,573	214,524,748
	36.1	1,276,614,498	1,254,241,780

අපවයවීම් සඳහා ප්‍රතිපාදන (සටහන 3.9.1 මූල්‍ය ප්‍රකාශ) සඳහා සමාගම විසින් ප්‍රතිපත්ති ස්ථාපනය කරනු ලබන අතර, එයින් පිළිඹිබු වන්නේ වෙළඳ ලැබීම් නියමිත තුලින් දැරීමට සිදුවන පාඩු පිළිබඳ ඇස්තමේන්තුවය. ස්ථාපනය කරන ලද අපමය ප්‍රතිපත්තිය අනුව අපවය පාඩු ගණනය කිරීමේදී ගණුදෙනු කරුවන් සමාලෝචනය කරනු ලැබේ. වෙළඳ ලැබීම් නියමිත හා අපමය පාඩු සඳහා ප්‍රතිපාදන සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශ සඳහා වූ 17.1 සටහන බලන්න.

36.1.3 වෙනත් මූල්‍ය වත්කම්

සමාගමේ වෙනත් මූල්‍ය වත්කම්වලින් ජනිත වන ණය අවදානමට අදාල වන දේ නම් බැංකුවල තිබෙන තැන්පත් සහ මුදල් හා මුදල් සාම්‍යයන්ය. සමාගම ණය අවදානමට නිරාවරණය වීමක් සිදුවන්නේ ගිවිසුම්වලට එළැඹි පාර්ශවයන් විසින් ගිවිසුමෙහි ඇති බැඳියාවන් ඉටු නොකිරීම සහ මෙකී මූල්‍ය උපකරණවල ඉදිරියට ගෙනයන වටිනාකම ඒවා උපරිම ලෙස සමාගනිරාවරණය වූ ප්‍රමාණයට සමාන වන විටය. මෙකී මූල්‍ය උපකරණ සම්බන්ධයෙන් පවත්නා මූල්‍ය අවදානම කළමනාකරණය කිරීම පිණිස සමාගම තම අරමුදල් රාජ්‍ය බැංකු හා ණය ශ්‍රේණිගත කෙරෙන බැංකුවල තැන්පත් කරයි.

36.2 ද්‍රවශීල අවදානම

ද්‍රවශීල අවදානම යනු තම මූල්‍ය බැඳියාවන් නියමිත කාලයට ඉටුකිරීමට සමාගම අපොහොසත් වීමයි. ද්‍රවශීලතාව කළමනාකරණය කිරීම සඳහා සමාගමේ ප්‍රවේශය වූ කලී සාමාන්‍ය සහ අනපේක්ෂිත තත්ත්වයන් යටතේ පිළිගත නොහැකි පාඩු නොදරමින් නියමිත වෙලාවට බැඳියාවන් ඉටුකිරීම පිණිස හැකිතාක් දුරට නිරන්තරයෙන්ම ප්‍රමාණවත් මුදල් තිබෙන බව සහතික කිරීමය.

සමාගම විසින් මූල්‍ය වත්කම් හා බැඳියාවන් අන්වේෂණය කරනු ලබන අතර, මාසික පදනමක් මත පුරෝකථනය කළ මෙහෙයුම් මුදල් ප්‍රවාහ පිළියෙල කරයි. ආංශික කාර්ය සාධනය අන්වේෂණය කිරීම් වස් වාර්ෂික අයවැය එක් එක් අවශ්‍යතා තුල පිළියෙල කෙරේ. සමාගමට තම මෙහෙයුම් කටයුතු කිරීමේදී ඇතිවන අවශ්‍යතා පිරිමසාලීම පිණිස ප්‍රමාණවත් මුදල් තිබෙන බව සහතික කිරීම පිණිස කළමනාකාරිත්වය විසින් පුරෝකථනය කල මාසික මෙහෙයුම් මුදල් ප්‍රවාහ වාර්ෂික අයවැය සහ ද්‍රවශීලතා අවශ්‍යතා අන්වේෂණය කෙරේ. වාර්තා කිරීමේ අවසාන දිනය වන විට ඉතිරිව ඇති කාල පරිච්ඡේදය පදනම් කරගෙන 2014 මාර්තු 31 දිනයට සමාගමේ මූල්‍ය වත්කම් හා බැඳියාවන් හි කල්පිරීම් විග්‍රහයක් පහත දැක්වේ. එහි හෙළිදරව් කරනු ලැබ ඇති මුදල් ප්‍රමාණයන් ගිවිසුම්වලට අදාල වට්ටම් නොකල මුදල් ප්‍රවාහයන්ය.

මූල්‍ය වත්කම් හා බැඳියාවන් වැඩි මූල්‍ය වත්කම්	ඉදිරියට ගෙන යන වටිනාකම	මාස 6/ මාස 6ට අඩු	මාස 6-12	වසරකට වඩා
AFS මූල්‍ය වත්කම්	30,997,790 - -			30,997,790
කල්පිරීම් ආයෝජන	291,653,566	291,653,566 - -		
කෙටිකාලීන ආයෝජන	224,010,853 -		193,978,479	30,032,374
වෙළඳ ලැබීම් නියමිත	1,276,614,498	1,276,614,498 - -		
වෙනත් ලැබීම් නියමිත	115,335,617	66,277,923	49,057,694	-
මුදල් හා මුදල් සාමායයන්	67,316,630	67,316,630 - -		
	2,605,928,,954	**1,701,862,617**	**243,036,173**	**61,030,164**

<u>මූල්‍ය බැඳියාවන්</u>

වෙළඳ ගෙවීම් නියමිත	794,510,230	794,510,230 - -		
වෙනත් ගෙවීම් නියමිත	(1,329,652)	(1,429,014)	99,632 -	
	793,180,578	793,081,216	99,632 -	

36.3 වෙළඳපොල අවදානම

වෙළඳපොල අවදානම යනු සමාගමේ ආදායම හෝ මූල්‍ය උපකරණ වල ඉදිරියට ගෙනයන වටිනාකමට බලපෑම් ඇතිවිය හැකි විදේශ විනිමය අනුපාතික වැනි වෙළඳපොල මිල ගණන්වල වෙනස්වීමය.

36.3.1 ව්‍යවහාර මුදල් අවදානම

වාර්තා කිරීමේ කාලපරිච්ඡේදය තුලදී එ.ජ. ඩොලරයට සාපේක්ෂකව ශ්‍රී ලංකා රුපියල නිදහසේ පාවීමට, ශ්‍රී ලංකා මහබැංකුව විසින් ඉඩදීමෙන් පසුව එ.ජ. ඩොලරයේ වටිනාකම හා අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල වටිනාකම උච්චාවචනය වීමෙන් උද්ගත විය හැකි අවදානම මෙනමින් දැක්වේ. එ.ජ. ඩොලරයට අනුව හා වෙනත් ව්‍යවහාර මුදල් අනුව සමාගම විසින් සපයන ලද සේවාවන්හි කාර්යාලීය ව්‍යවහාර මුදල් සහ යම් යම් වෙළඳ ලැබීම් නියමිත හා ගෙවීම් නියමිත විදේශ ව්‍යවහාර මුදල් අනුව දක්වා ඇත.

2013 වර්ෂය සඳහා වූ වාර්තා කිරීමේ කාලය තුල සමාගම විසින් නව මෙහෙයුම් තුල සිදුකල විදේශ විනිමය ඉපැයීම්වල වටිනාකම රු. 45,252,357 විදේශ ව්‍යවහාර මුදලින් සඳහන් කරන ලද වෙළඳ ලැබීම් නියමිත පිළිබඳ මූල්‍ය ප්‍රකාශ 19.1 සටහනින් දක්වා ඇත.

36.3.2 පොලී අවදානම

කෙටිකාලීන බැංකු තැන්පතු භාණ්ඩාගාර බිල්පත් හා කාලීන තැන්පතු සම්බන්ධයෙන් සිදුවන වෙළඳපොල පොලී අනුපාතික වෙනස්වීම් වලින් සමාගමට ඇතිවිය හැකි අවදානම මෙයින් දැක්වේ. කාලීන තැන්පතු ඇතුළුව, රාජ්‍ය බැංකු ණය ශ්‍රේණිගත බැංකුවල, සමාගමේ බැංකු ශේෂ පවතී. පොලී අනුපාතික වෙනස්වීම් අධීක්ෂණ කටයුතුවල සමාගම සක්‍රීය ලෙස නිරතව සිටින අතර එයින් ඇතිවිය හැකි අවදානම පිළිබඳව අන්වේෂණය කරයි.

36.4 ප්‍රාග්ධන කළමනාකරණය

තම කොටස්කරුවන්ට උපරිම ප්‍රතිලාභ සලසාදීම සහ උපරිම ප්‍රාග්ධන ආකෘතියක් පවත්වා ගැනීම මගින් ප්‍රාග්ධන පිරිවැය අඩුකර ගැනීම උදෙසා, ක්‍රියාත්මක වන ආයතනයක් වශයෙන් තවදුරටත් පවත්වා ගැනීමට සමාගමේ ඇති හැකියාව රඳවා ගැනීම පිණිස තම ප්‍රාග්ධනය කළමනාකරණය කරයි. ගියරුම් අනුපාතය ගණනය කරනු ලබන්නේ සමාගමේ මුළු කොටස් ස්කන්ධ ධාරිතාවට අනුව ණය ගැනුම් ප්‍රමාණය අතර සම්බන්ධතාව සලකා බැලීමෙනි. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා ඇති පරිදි මුළු ණයට ගැනුම් ප්‍රවර්තන නොවන හා ප්‍රවර්තනයට ගැනුම්වලින් සමන්විත වේ.

2014 වර්ෂයේ හා 2013 වර්ෂයේ මාර්තු 31 දිනට සමාගමේ මුළු ණයට ගැනුම් හා කොටස් අනුපාතය පහත දැක්වෙන වගුවෙන් පෙන්නුම් කෙරේ.

ප්‍රාග්ධන පංතිය	2014	2013
මුළු ණයට ගැනුම්	-	-
මුළු කොටස් ස්කන්ධය	1,209,529,422	589,671,041
ගියරුම් අනුපාතය(x)	නැත	නැත